# බේරුවල නගර සභාව

**2022.05.24 දින පැවති බේරුවල නගර සභාවේ මාසික මහා සභා රැස්වීමේ සංක්ෂිප්ත වාතර්ාව**

රට තුළ උද්ගතව පැවති අබර්ුදකාරී වාතාවරණය නිසා පැනවූ ඇදිරි නීතිය හේතුවෙන් අප්‍රේල් මාසයට අදාල මාසික මහ සභා රැස්වීම 2022.05.10 වන දින පැවැත්වීමට දින නියමව පැවතියද එම රැස්වීම 2022.05.24 දින පවත්වන ලදි.ඒ අනුව ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාපති අල්හාජ් ඇම්.මසාහිම් මොහොමඩ් මහතාගේ ප්‍රධානත්වයෙන් පෙ:ව:10.00 ට සභා රැස්වීම ආරම්භ විය.

**සහභාගිත්වය**

| | | | |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | - | අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා |
| 2. | ගරු උප සභාපති | - | එම්.ආර්.එම්.මුනව්වර් මහතා |
| 3. | ගරු මන්ත්‍රී | - | එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා |
| 4. | ගරු මන්ත්‍රී | - | එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා |
| 5. | ගරු මන්ත්‍රී | - | අහමඩ් දිල්සාත් මහතා |
| 6. | ගරු මන්ත්‍රී | - | අල්හාජ් එම්.එන්.ෆවුසුල් අමීර් මහතා |
| 7. | ගරු මන්ත්‍රිනී | - | කේ.උදේනි අමල්කා ප්‍රනාන්දු මහත්මිය |
| 8. | ගරු මන්ත්‍රී | - | එම්.එම්.එම්.සියාන් මහතා |
| 9. | ගරු මන්ත්‍රිනී | - | එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙනවිය |
| 10. | ගරු මන්ත්‍රී | - | එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා |
| 11. | ගරු මන්ත්‍රී | - | අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා |
| 12. | ගරු මන්ත්‍රිනී | - | එම්.එච්.ෆාතිමා රිනූසා මහත්මිය |

**නොපැමිණි සභිකයින්**

| | | | |
|---|---|---|---|
| 1. | ගරු මන්ත්‍රිනී | - | එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මහත්මිය |
| 2. | ගරු මන්ත්‍රී | - | එම්.එෆ්.එම්.හසන් මහතා |
| 3. | ගරු මන්ත්‍රී | - | අල්හාජ් පී.එම්.එම්.උස්මාන් මහතා |
| 4. | ගරු මන්ත්‍රී | - | එම්.ජේ.එම්.එච්.මොහමඩ් නස්මි මහතා |

**සහභාගී වූ නිලධාරීන්**

| | | | |
|---|---|---|---|
| 1. | ලේකම් | - | අශෝක රණසිංහ මහතා |
| 2. | වැඩ අධිකාරි | - | ජේ.කේ.සී.ජයනෙත්ති මහතා |
| 3. | ආදායම් පරීක්ෂක | - | පී.ඩී.පී.එස්.අබේගුණවධර්න මහතා |
| 4. | සංවධර්න නිලධාරි (සභා කටයුතු) | - | වත්සලා කුමාරි තම්මිට මිය |

**අ. 2022.04.21 දින පැවැති මාසික මහ සභා රැස්වීම් වාතර්ාව සභා සම්මත කිරීම.**

2022.04.21 වන දින පැවති මාසික සභා රැස්වීම් වාතර්ාව සත්‍ය වාතර්ාවක් බවට ගරු මන්ත්‍රී එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා විසින් කරන ලද යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්.එම්.සියාන් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත විය.

**ආ. සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන.**

**ආ.1** ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතාගේ පියාගේ අභාවය වෙනුවෙන් සභාපතිතුමා,උපසභාපතිතුමා, මන්ත්‍රිතුමන් හා මන්ත්‍රිතුමියන්ගේ ශෝකය එල කර සිටින අතර

ලේකම්තුමා ඇතුළු කායර්ය මණ්ඩලයේ ශෝකයද පවුලේ සියළු දෙනා වෙත එල කර සිටිමු.මේ සම්බන්ධ ශෝක පණිවිඩයක් එතුමා වෙත යවන ලෙස දැනුම් දෙමි.

**ඇ. නොපැමිණ සිටිමේ අවසරය පිළිබඳ යෝජනා.**

ඇ.1 ගරු මන්ත්‍රිනී එම්.ජේ.එච්.ඒ.පද්මකාන්ති මහත්මිය විභාග රාජකාරී හේතුවෙන් මෙම මස මාසික මහ සභා වාරය සඳහා පැමිණිමට නොහැකි බව ලිපියක් මගින් දැනුම් දී ඇත.එබැවින් එදිනට නිවාඩු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රිනී කේ.උදේනි අමල්කා ප්‍රනාන්දු මහත්මිය ස්ථිර කරන ලදුව බෙදිමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

ඇ.2 ගරු මන්ත්‍රි එම්.එෆ්.එම්.හසන් මහතා මෙම මස මාසික මහ සභා වාරය සඳහා පැමිණිමට නොහැකි බව ලිපියක් මගින් දැනුම් දී ඇත.එබැවින් එදිනට නිවාඩු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රි එම්.එම්.එම්.සියාන් මහතා ස්ථිර කරන ලදුව බෙදිමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

ඇ.3 ගරු මන්ත්‍රි පී.එම්.එම්.උස්මාන් මහතා මෙම මස මාසික මහ සභා වාරය සඳහා පැමිණිමට නොහැකි බව දූරකථන පණිවිඩයක් මගින් දැනුම් දී ඇත.එබැවින් එදිනට නිවාඩු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රි එම්.එම්.එම්.සියාන් මහතා ස්ථිර කරන ලදුව බෙදිමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

ඇ.4 ගරු මන්ත්‍රි එම්.ජේ.එම්.එච්.මොහමඩ් නස්මි මහතා මෙම මස මාසික මහ සභා වාරය සඳහා පැමිණිමට නොහැකි බව දූරකථන පණිවිඩයක් මගින් දැනුම් දී ඇත. එබැවින් එදිනට නිවාඩු අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රි එම්.එම්.එම්.සියාන් මහතා ස්ථිර කරන ලදුව බෙදිමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඇ. සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරීම.**

ඇ.1. මහජන සෞඛ්‍ය පරීක්ෂක ආර්. ඩී.ටී.නයනජිත් මහතා විසින 2022.05.23 දින සහිතව ඉන්ධන දීමනාව ලබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කිරීම. **(ඇමුණුම 01)**

**ගරු සභාවේ දැන ගැනීම සඳහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

ඇ.2 ගරු මන්ත්‍රි එම්.එම්.එම් සියාන් මහතා විසින් පිටවල හංදියේ සිට ෂේක් හුනප්පා මාවතට හැරෙන හංදියේ මාගර්යේ කොටසක් අබලන් වීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කිරීම. **(ඇමුණුම 02)**

**ගරු සභාවේ දැන ගැනීම සඳහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

**ඇ.3** ගරු මන්ත්‍රී එම්.එම්.එම් සියාන් මහතා විසින් දීනගොඩ රවුෆ් හජ්ජියාර් ඇවනියු පාර කෙලවර සිට මැද දක්වා කාණු පද්ධතිය පිරිසිදු කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කිරීම.**(ඇමුණුම 03)**

**ගරු සභාවේ දැන ගැනීම සදහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

**ඇ.4** දකුණු පළාත් කෘෂිකමර් අධ්‍යක්ෂ,විසින් 2022.05.05 දින සහිතව ඉදිරිපත් කර ඇති ලිපිය හදිසි සැත්කමක් සඳහා මුදල් ආධාර ලබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය සභාගත කිරීම.**(ඇමුණුම 04)**

**ගරු සභාවේ දැන ගැනීම සදහා මෙම ලිපිය සභාගත කරන ලදි.**

**ඉ. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**
නැත.

**ඊ. යථා පරිදි කල්දී ඇති යෝජනා**

**ඊ.1 ගරු සභාපති අල්හාජ් එම්. මසාහිම් මොහොමඩ් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

**ඊ.1.1** **ඊ.1.1** 2021.12.14 වන දින මහ සභාවේ ඊ 1.25 යෝජනා සම්මුතිය අනුව මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව ආවරණ අනුමැතියට යටත්ව ගෙවන ලද පහත ගෙවීම් සහා අනුමැතියට ගරු සභාවට යෝජනා කරමි.

| දිනය | නම | විස්තරය | වවුචර් අංකය | මුදල (රු:) |
|---|---|---|---|---|
| 3.2 | ඩී.ඇන්ඩ්.ඩී.මෝටසර් සහ සවරීස් | RD – 7379 ට්‍රැක්ටරයේ සම්පූණර් සේවාව වෙනුවෙන් ගෙවීම් කිරිම. | 01 | 45,280.00 |
| 3.2 | එම්.එස්.පී.ෂමරීලා මිය | 2022.01.11 වන දින පැවති මාසික සභා වාතර්ාව දෙමළ භාෂාවට පරිවථර්නය කිරීම සඳහා පරිවථර්න ගාස්තු ගෙවීම.<br><br>වචන ප්‍රමාණය - 17,003<br>එක් වචනයක ගාස්තුව - 2.50<br>ගෙවීම් ගාස්තු - 45,522.50 | 02 | 45,522.50 |
| 3.2 | මුදල් භාරකරු මගින් පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල් මයා | ඉන්ධන හිඟය නිසා වෙනත් ඉන්ධන පිරවුම් හල්වලින් ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරමක් ලබා ගැනීම | 05 | 25,000.00 |
| 3.2 | මුදල් භාරකරු මගින් | සුළු අක් මුදල් අළුත් කිරීම (බිල්පත් 35 ක් සඳහා) | 06 | 10,259.00 |
| 3.2 | මුදල් භාරකරු මගින් | බේරුවල නගර සභාවේ ලේකම් අසෝක රණසිංහ මහතාගේ 2022 පෙබරවාරි මාසය සඳහා නිවාඩු දින වැටුප් ගෙවීම. (දින 05)<br><br>1. 2022.02.04 ,<br>2. 2022.02.05 | 09 | 17,621.25 |

| | | | | |
|---|---|---|---|---|
| | | 3. 2022.02.06<br>4. 2022.02.19<br>5. 2022.02.20<br>= 70,485 X 05<br>20<br>= 17,621.25 | | |
| 3.2 | මුදල් භාරකරු මඟින්<br>ලේකම් අසෝක<br>රණසිංහ මයා | බේරුවල නගර සභාවේ ලේකම් තනතුරෙහි රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් 2022 පෙබරවාරි මස සඳහා දීමනාව හා දුරකථන දීමනාව ගෙවීම.<br>(රු.73,155 X 6 = 12,192.50) + රු.2,000.00)<br>= 12,192.00 + 2,000.00<br>= 14,192.50 | 10 | 14,192.50 |
| 3.3 | මුදල් භාරකරු මඟින්<br>පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල්<br>මයා | ඉන්ධන හිඟය නිසා වෙනත් ඉන්ධන පිරවුම් හල්වලින් ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරමක් ලබා ගැනීම | 12 | 25,000.00 |
| 3.3 | ඒ.පී.අයි.ට්‍රේඩ්ස් (පුද්)<br>සමාගම | බෙලින් මැෂිමේ අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම. | 14 | 99,630.00 |
| 3.7 | මුදල් භාරකරු මඟින් | 2022 මාර්තු මස වැටුප් අත්තිකාරම් ගෙවීම | 16 | 36,500.00 |
| 3.7 | මුදල් භාරකරු මඟින් | 2022 පෙබරවාරි මස පෙර පාසල් ගුරු දීමනාව ගෙවීම. | 17 | 13,110.00 |
| 3.7 | මුදල් භාරකරු මඟින් | 2022 පෙබරවාරි මස ඩෙංගු ව්‍යාපෘති සේවකයින් 15 දෙනෙකුගේ වැටුප් ගෙවීම.<br>වැටුප් මුදල = රු. 409,538.74<br>සභාපති රාජ්‍ය සේවා අර්ථ සාධක<br>අරමුදල = රු. 76,492.43<br>එකතුව = රු. 486,031.17 | 18 | 486,031.17 |
| 3.7 | මුදල් භාරකරු මඟින් | 2022 පෙබරවාරි මස ආදේශක කම්කරු සේවකයින් 03 දෙනෙකුගේ වැටුප් ගෙවීම.<br>වැටුප් මුදල = රු. 68,335.71<br>සභාපති රාජ්‍ය සේවා අර්ථ සාධක<br>අරමුදල = රු 13,350.00<br>එකතුව = රු. 81,685.71 | 19 | 81,685.71 |
| 3.7 | එම්.ඒ.අෂ්රෆ් සාහි මයා | 2022 මාර්තු මස මහජන සම්බන්ධතා නිලධාරි දීමනාව ගෙවීම | 22 | 15,000.00 |
| 3.7 | මුදල් භාරකරු මඟින්<br>පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල්<br>මයා | ඉන්ධන හිඟය නිසා වෙනත් ඉන්ධන පිරවුම් හල්වලින් ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරමක් ලබා ගැනීම | 24 | 25,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 3.8 | මුදල් භාරකරු මඟින් අරුණි මංගලිකා ද සිල්වා මිය | කෙරවලපිටිය කසල යැවීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම | 26 | 10,000.00 |
| 3.8 | මුදල් භාරකරු මඟින් | 2022 පෙබරවාරි මාසය සඳහා කමර්ාන්ත අංශයේ 29 වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම. | 29 | 232,121.00 |
| 3.8 | මුදල් භාරකරු මඟින් | 2022 පෙබරවාරි මාසය සඳහා කායර්ාල අංශයේ (20) වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම. | 30 | 115,679.00 |
| 3.8 | මුදල් භාරකරු මඟින් | 2022 පෙබරවාරි මාසය සඳහා සෞඛ්‍ය අංශයේ (68) වෙනුවෙන් අතිකාල දීමනා ගෙවීම. | 31 | 470,221.00 |
| 3.10 | බී ඇම්.කල්පගේ පුෂ්පකුමාර මයා | LE – 7536 කැබ් රථයේ අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම. | 32 | 32,075.00 |
| 3.10 | ඉසිවරි එන්ටප්‍රර්යිසස් | සෞඛ්‍ය අංශයට අවශ්‍ය ද්‍රව්‍ය හා උපකරණ ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 35 | 157,800.00 |
| 3.10 | කේ.වී.සී.ජයසංඛ | පරිගණක අළුත්වැඩියා කිරීම හා වෛරස් ගාඩ් ඇතුලත් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 37 | 14,600.00 |
| 3.10 | මුදල් භාරකරු මඟින් ජේ.කේ.සී ජයනෙත්ති මයා | 2022 පෙබරවාරි මාසය සඳහා වැඩ අධිකාරි ජේ.කේ.සී.ජයනෙත්ති මයාගේ නිවාඩු දින වැටුප් ගෙවීම.<br>1. 2022.02.04<br>2. 2022.02.06<br>3. 2022.02.12<br>4. 2022.02.19<br>5. 2022.02.26<br>= 59,050 X 05 / 20<br>= 14,762.50 | 39 | 14,762.50 |
| 3.10 | මුදල් භාරකරු මඟින් පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල් මයා | ඉන්ධන හිඟය නිසා වෙනත් ඉන්ධන පිරවුම් හල්වලින් ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරමක් ලබා ගැනීම | 40 | 25,000.00 |
| 3.10 | මුදල් භාරකරු | අනුෂ්ක ජීවකුමාර මයාගේ 2022 පෙරවාරි මාසය සඳහා අතිකාල දීමනාව ගෙවීම. | 44 | 19,593.00 |
| 3.11 | මුදල් භාරකරු | අනුෂ්ක ජීවකුමාර මයාගේ 2022 ජනවාරි මාසය සඳහා අතිකාල දීමනාව ගෙවීම. | 46 | 22,120.00 |
| 3.14 | සුදශරී කන්ස්ට්‍රක්ෂන්ස් | චීනකොටුව පල්ලිය ඉදිරිපිට කාණුව ඉදිකිරීම.<br>1. 10% අතරුදවුම - 45,033.50<br>2. කායර් සාධන සුරක්ෂණය (I11966/2021.10.24) - 25,580.37<br>ගෙවිය යුතු මුදල - 70,613.87 | 47 | 70,613.87 |

| | | | | |
|---|---|---|---|---|
| 3.14 | සුදශරී කන්ස්ට්‍රක්ෂන්ස් | රේගුව පාර කොන්ක්‍රිට් දැමීම.(96 බී සිට 90/4 නිවස දක්වා කොටස)<br><br>1. 10% අතරුදවුම - 23,938.14<br>2. කායර් සාධන සුරක්ෂණය (I11966/2021.10.24) - 11,894.58<br>ගෙවිය යුතු මුදල - 35,832.72 | 48 | 35,832.72 |
| 3.14 | සුදශරී කන්ස්ට්‍රක්ෂන්ස් | ෂේක් මුස්තෆා පල්ලිය පාර ඉතිරි කොටස සමඟ බට යෙදීම.<br>10% අතරුදවුම් මුදල = 10,416.12<br>කායර්සාධන සුරක්ෂණ = 63,503.11<br>(I11968/2021.10.04)<br>ගෙවිය යුතු මුදල = 173,919.23 | 49 | 173,919.23 |
| 3.14 | කාන්ති පොත්හල | බේරුවල මහජන පුස්තකාලයට 2022 ජනවාරි මාසය ලබා ගත් පුවත්පත් සඳහා ලබාගත් මුදල් ගෙවීමට පුවත්පත් සඳහා ගෙවීම් කිරීම.<br>2022 ජනවාරි මාසයට ගෙවිය යුතු මුදල =30,560.00 | 51 | 30,560.00 |
| 3.15 | ඩබ්.එස්.ඩී.එස්.මධුෂානි මිය | බේරුවල නගර සභාවට අනුයුකුත කර සිටින 2022.04.01 දිනට ස්ථිර වීමට නියමිත ඩබ්.එස්.ඩී.එස්.මධුෂානි මියගේ ජනවාරි හා පෙබරවාරි මාස වලට අදාළ දීමනාව ගෙවීම.<br>(රු.20,000 X 2) | 53 | 40,000.00 |
| 3.15 | කේ.වී.එන්.හෂර්නී මිය | බේරුවල නගර සභාවට අනුයුකුත කර සිටින 2022.04.01 දිනට ස්ථිර වීමට නියමිත කේ.වී.එන්.හෂර්නී මියගේ ජනවාරි හා පෙබරවාරි මාස වලට අදාළ දීමනාව ගෙවීම.<br>(රු.20,000 X 2) | 54 | 40,000.00 |
| 3.15 | මුදල් භාරකරු මහින් කේ.එස්.එන්.පෙරේරා මයා | අපහරණය කිරීමට නියමිත වාහන වල ආදායම් බලපත්‍ර ලබා ගැනීම.<br>46 – 3232 ටේලරය<br>RV – 7165 ටේලරය<br>GF – 7735 අත්ට්‍රැක්ටරය<br>RV – 4767 ටේලරය<br>RV – 4876 ටේලරය<br>JY – 2495 ටේලරය<br>RV – 4764<br>RV - 0895 | 56 | 25,000.00 |
| 3.15 | එන්.එන්.එස්.එස්.ඩයස් මිය | නගර සභාවේ සේවය කරන පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනි එන්.එන්.එස්.එස්.ඩයස් මිය වෙත 2022 වෂර්යට හිමි නිල ඇඳුම් දීමනාව ගෙවීම. | 57 | 14,000.00 |
| 3.15 | ධනිඳු කන්ස්ට්‍රක්ෂන්ස් | සාවියා පටුමඟ අතුරු මාගර්යේ තාර දැමීම.<br>10% අතරුදවුම් = 17,621.37<br>කායර්සාධන සුරක්ෂණය = 8,203.59<br>25,824.96 | 58 | 25,824.96 |
| 3.15 | ධනිඳු කන්ස්ට්‍රක්ෂන්ස් | දගර්ා පාර කාණුව ඉදි කිරීම (33A නිවසේ සිට 27 නිවස දක්වා )<br>10% අතරුදවුම් = 16,984.02<br>කායර්සාධන සුරක්ෂණය = 8,812.31<br>(8.4 I7970/2020.12.30) = 25,796.33 | 59 | 25,796.33 |

| | | | | |
|---|---|---|---|---|
| 3.18 | ශ්‍රී ලංකා ටෙලිකොම් ලිමිටඩ් | කාර්යාලීය දුරකතන බිල්පත් නිරවුල් කිරීම.<br>01.සභාපති - 2,328.21<br>02.ෆැක්ස් යන්ත්‍රය - 1,164.72<br>03.පිළිගැනීමේ නිලධාරි - 1840.27<br>04.ලේකම් (කාර්යාලය) - 9287.55<br>05.වරිපනම් අංශය - 297.00<br>06.කර්මාන්ත අංශය - 617.32<br>07.රවුටරය - 980.81<br>08.නැණසල - 2421.77<br>09.උප සභාපති - 611.79<br>එකතුව - 19,549.44 | 60 | 19,549.44 |
| 3.18 | එම්.ඩී.ඒ.කේ.ගුණරත්න මයා | කසළවත්තේ කසළ තුනී කිරීම සඳහා වෙන් ලෝඩරය ලබා ගැනීම වෙනුවෙන් 2022.02.10 දින සිට 2022.03.12 දින දක්වා මී.පැය 108.3<br>මී.පැය 108.3 x 1850.00 = 200,355.00<br>එම මුදලින් 50% =<br>ගෙවිය යුතු මුදල = 100,177.00 | 61 | 100,177.50 |
| 3.18 | මුදල් භාරකරු | සුළු අත් මුදල් අළුත් කිරීම (බිල්පත් 40ක් සඳහා) | 67 | 13,496.00 |
| 3.18 | මුදල් භාරකරු | ඩී.ඒ.මල්ලිකා රණවක මියගේ 2022 පෙරවාරි මාසය සඳහා දීමනාව ගෙවීම | 68 | 36,054.80 |
| 3.21 | සාමාන්‍යාධිකාරී සී/ස බේරුවල විවිධ සේවා සමූ.සමිතිය | 2022 වසර සඳහා සභාව සතු වාහන වෙත ඉන්ධන සැපයීම වෙනුවෙන් ආරක්ෂිත ඇප මුදල් තැන්පත් කිරීම. | 71 | 100,000.00 |
| 3.21 | සී/ස කළුතර දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු සංගමය | කාර්යාලයට අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 72 | 199,850.00 |
| 3.21 | මුදල් භාරකරු මඟින් පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල් මයා | ඉන්ධන හිඟය නිසා වෙනත් ඉන්ධන පිරවුම් හල්වලින් ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 73 | 25,000.00 |
| 3.22 | සුදශරී කන්ස්ට්‍රක්ෂන්ස් | මුහුදට කසළ යාම වැලැක්වීම සඳහා ආවරණයක්ද සහිතව මරදාන ලෙල්ලමෙහි (මාළු වෙළඳසැල) කාණු පද්ධතිය ඉදි කිරීම.<br>10% අතරුදවුම් මුදල = 194,076.51<br>කාර්යසාධන සුරක්ෂණය = 97,550.13<br>291,626.64 | 74 | 291,626.64 |
| 3.22 | බී.ඇම්. කල්පගේ පුෂ්පකුමාර මයා | RY – 6319 ටේලරයේ අළුත්වැඩියාව වෙනුවෙන් ගෙවීම. | 75 | 107,984.94 |
| 3.22 | ශ්‍රී විජය මුද්‍රණ ශිල්පියෝ | කාර්යාලයට අවශ්‍ය ලිපිශීෂර් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.<br>ලිපි ශීෂර් 100 පැකට් 100X 2640.00<br>= රු. 264,000.00 | 76 | 264,000.00 |
| 3.22 | ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය | කාර්යාලීය ජල බිල්පත් නිරවුල් කිරීම.<br>01.එළඳලොඩ සායනය මාතෘ සායනය - 326.70<br>02.පොල්කොටුව මාතෘ සායනය - 287.10<br>03.ප්‍රජා ශාලාව - 404.64<br>04.කාර්යාලය - 24152.40<br>05.පොදු වැසිකිළි පද්ධතිය - 11171.52<br>06. එළඳලොඩ සායනය මාතෘ සායනය - 432.18<br>07 උස්මාන් කන්ද සායනය - 672.84 | 78 | 37,447.38 |

| | | | | |
|---|---|---|---|---|
| 3.22 | මුදල් භාරකරු මහින් පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල් මයා | ඉන්ධන හිඟය නිසා වෙනත් ඉන්ධන පිරවුම් හල්වලින් ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරම් ලබා ගැනීම. | 84 | 25,000.00 |
| 3.23 | ඩී.ඇන්ඩ්.ඩී.මෝටසර් සහ සවරීස් | RG – 8222 ට්‍රැක්ටර් සම්පූණර් සේවාව වෙනුවෙන් ගෙවීම. | 85 | 26,232.00 |
| 3.23 | ඩී.ඇන්ඩ්.ඩී.මෝටසර් සහ සවරීස් | PE – 6864 කැබ් රථයේ සම්පූණර් සේවාව කිරීම වෙනුවෙන් ගෙවීම. | 86 | 30,065.00 |
| 3.23 | ඩී.ආර්.ඉන්ඩ්‍රස්ටීස්(ප්‍රයි) ලිමිටඩ් | වරිපනම් ජංගම කායර්ාල සඳහා අවශ්‍ය රවුම් මේස ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.<br>රවුම් මේස 03 X 4500 = රු. 13,500.00 | 87 | 13,500.00 |
| 3.23 | ෆින්ටෙක් මැනේරිඩ් සොලුයුෂන් ප්‍රයිවට් ලිමිටඩ් | ලේඛනාගාරයේ ඡායා පිටපත් යන්ත්‍රය උපාංග යොදා අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 88 | 36,450.00 |
| 3.23 | සිරිවධර්න මෝටර් ස්ටෝසර් | 50 ශ්‍රී 6101 කැබ් රථය සඳහා අවශ්‍ය අමතර කොටස් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 89 | 36,760.00 |
| 3.23 | ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය | ශ්‍රී ලංකා පළාත් පාලන ආයතනයන්ගේ සංසදය වෙත 2022 වෂර්ය සඳහා සාමාජික අරමුදල් ගෙවීම. | 90 | 25,000.00 |
| 3.23 | රත්න ටයර් ප්‍රයිවට් ලිමිටඩ් | LL – 7579 කැබ් රථය සඳහා අවශ්‍ය 120A එක්සයිඩ් බැටරියක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම.<br>බැටරිය - 01 = 33,300.00<br>පරණ බැටරිය = 2,500.00<br>අඩු කළා = 30,800.00 | 91 | 30,800.00 |
| 3.23 | මෙට්‍රො පොලිටන් ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ් | කායර්ාලය සඳහා අවශ්‍ය කාට්රිජ් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 92 | 37,800.00 |
| 3.23 | මුදල් භාරකරු මහින් - පී.කේ.ඩී.ආර්.ප්‍රියලාල් මයා | "සුරක්ෂිත පුරවරයක් නිරෝගීමත් හෙටක්" වැඩසටහන 2022.03.24 දින පැවැත්වෙන අතර ඒ සඳහා සහභාගී වන ආරාධිත අමුත්තන්ට සහ දේශනයට සහභාගීවනනන් හට සංග්‍රහ කිරීමට අත්තිකාරමක් ලබා ගැනීම. | 93 | 17,500.00 |
| 3.24 | මුදල් භාරකරු | 2022 මාතර්ු මස ජේ.කේ.සී. ජයනෙත්ති මයාගේ දීමනාව ගෙවීම. | 102 | 62350.00 |
| 3.25 | ආෂිකා මෝටසර් | PE – 6864 කැබ් රථයේ රේඩියේටර් එකක් හා රේඩියේටර් කූලන්ට් යොදා අළුත්වැඩියා කිරීම | 103 | 56,600.00 |
| 03.28 | මෙට්රෝ ස්ටේෂනරි | කායර්ාලය සඳහා අවශ්‍ය ලිපි ද්‍රව්‍ය ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම් කිරීම. | 105 | 53,115.00 |

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්තිර් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඊ.1.2** 2022.12.31 අවසාන ගිණුමෙන් නිවැරදි කිරීම සඳහා ඉදිරිපත් කර ඇති 2014 වෂර්යේ සිට 2019 වෂර්ය දක්වා ණය හිමි ලේඛනය තුළ ආපසු ගෙවා නොමැති ණය හිමි ප්‍රතිපාදන ලෙස රු 2,869,965.93 ක මුදලක් සමුච්චිත අරමුදලට බැර කර ඇත. එසේ බැරකරන ලද මුදල තුල ඇතුලත්ව ඇති ,බේරුවල වදකහවෙල මොරිස් මහතාගේ නිවස පාරේ අවසාන කොටස කොන්ක්‍රිට් කිරීම සඳහා වන ව්‍යාපෘතියේ 10% ක අතරුදවුම් මුදල වන රු 16603.96 ක මුදලක් සමුච්චිත අරමුදලින්, හෙට්ටිමුල්ල ග්‍රාම සංවධර්න සමිතිය වෙත ගෙවීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්තිර් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සභා සම්මත කරන ලදි.**

**ඊ.1.3** 2022.04.26 වන දින ප.ව 2.30 ට පැවති ටෙන්ඩර් මණ්ඩල වාතර්ාව අනුමත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ.1.4** 2022 වර්ෂයේ ජුනි මාසයට යෙදෙන පොසොන් පොහොය දිනය නිමිත්තෙන් නගර සභා කායර් මණ්ඩලය සඳහා සීල ව්‍යාපාරයක් සහ නගර සභා පරිශ්‍රයේ සැරසිලි කටයුතු සිදුඅ කිරීම සඳහා සකස් කරන ලද දළ ඇස්තමේන්තු මුදල වන රු.97,700.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත්, එම මුදල සහා අරමුදලින් වියදම් දැරීමටත්, එම වියදම දැරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමටත් ගරු සභාවට යෝජනා කරමි. **(ඇමුණුම 05)**

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ1.5** බේරුවල නගර සභාවට අයත් ආයුවෙර්ද ගොඩනැගිල්ල ඉදිකිරීම අදියර 2 ව්‍යාපෘතිය 2022.04.26 වන දින ටෙන්ඩර් විවෘත කරන ලදුව තාක්ෂණ ඇගයීම් කමිටුවට යොමු කරන ලදි.තාක්ෂණ ඇගයීම් කමිටුවේ නිදෙර්ශය අනුව ඉංජිනේරු ඇස්තමේන්තු මුදල වන රු 5979294.35 කට අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති මලින්ද සප්ලයසර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ආයතනයෙන් විමසා ලබා දීමට නිදෙර්ශ කර ඇත.ඒ අනුව මලින්ද සප්ලයසර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙතින්, ඉංජිනේරු ඇස්තමේන්තු මුදලට ව්‍යාපෘතිය ඉටු කිරීමට එකඟ වී ඇති බැවින් රු 5979294.35 ක මුදලකට බේරුවල නගර සභාවට අයත් ආයුවෙර්ද ගොඩනැගිල්ලේ ඉදිකිරීම අදියර 2 ව්‍යාපෘතිය ඉටු කිරීමට එම ආයතනය වෙත ලබා දීමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ1.6** බේරුවල නගර සභා සේවකයින්ගේ බෝ නොවන රෝග හදුනා ගැනීම සඳහා එක් දින සායන වැඩසටහනක් පැවැත්වීමට අදාලව සකස් කරන ලද දළ ඇස්තමේන්තු මුදල වන රු.100,000.00 ක වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීමටත්, එම මුදල සහා අරමුදලින් වියදම් දැරීමටත්, එම වියදම දැරීමට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමටත් ගරු සභාවට යෝජනා කරමි. **(ඇමුණුම 06)**

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

**ඊ 1.7** බේරුවල නගර සභා බල ප්‍රදේශයේ සෞඛ්‍ය කටයුතු අධික්ෂණය කරනු ලබන මහජන පරීක්ෂකවරුන් වෙත එක් අයෙකුට මසකට ඉන්ධන ලීටර් 10 බැගින් ලබා දිමට ගරු සභාවට යෝජනා කරමි.

**ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී එච් සජිත් දේවප්‍රිය සිල්වා මහතා ස්ථිර කරන ලදුව බෙදීමක් නොතිබූ බැවින් ඒකමතිකව සහා සම්මත කරන ලදි.**

උ. **කාරක සභා වාතර්ා පිළිබඳ සමාලෝචනය**

උ.1 **2022 .04.26 වන දින පැවති ටෙන්ඩර් මණ්ඩල වාතර්ාව**

# 2022.04.26 - ප්‍රසම්පාදන මණ්ඩල වාතර්ාව

2022.04.26 දින ප.ව. 2.30 ට ගරු සභාපතිතුමාගේ නිල කාමරයේදී පැවති ප්‍රසම්පාදන මණ්ඩල වාතර්ාව.

**ප්‍රසම්පාදන මණ්ඩලයයේ සහභාගීත්වය.**

| | | |
|---|---|---|
| සභාපති | - | අල්හාජ් ඇම්.මසාහිම් මොහොමඩ් මහතා |
| සාමාජික | - | ගරු උප සභාපති, එම්.ආර්.එම්.මුනව්වර් මහතා |
| සාමාජික | - | ගරු මන්ත්‍රී ඇම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා |
| සාමාජික | - | ගරු මන්ත්‍රී අහමඩ් දිල්සාත් මහතා |
| සාමාජික | - | ගරු මන්ත්‍රී එම්.එස්.මොහොමඩ් මුස්පිර් මහතා |

<u>නිලධාරි මණ්ඩලය</u>

| | | |
|---|---|---|
| ලේකම් | - | අශෝක රණසිංහ මහතා |
| පරිපාලන නිලධාරි | - | ඩබ්ලිව් .ඒ අජිත් කිත්සිරි මහතා |
| තාක්ෂණ නිලධාරි | - | කේ.කේ.අයිරාංගනී මෙනවිය |
| සංවධර්න නිලධාරි (සභා කටයුතු) | - | වත්සලා කුමාරි තම්මිට මහත්මිය |
| කළමණාකරණ සේවා නිලධාරි (කමර්ාන්ත) | - | ශාලිකා පෙරේරා මහත්මිය |

**01.** **බේරුවල නගර සභාවට අයත් ආයුවෙර්ද ගොඩනැගිල්ල ඉදි කිරීම (දෙවන අදියර) ව්‍යාපෘතිය සඳහා ටෙන්ඩර් පත් විවෘත කිරීම.**

| ආයතනය | වැට් බදු රහිත ලංසු මුදල (රු.) |
|---|---|
| 1. මලින්ද සප්ලයසර් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන්, චාමර උයන, අඹේපිටිය. | 6,917,796.40 |
| 2. සදනර් කන්ස්ට්‍රක්ෂන්, නො.123 ඒ, වීනකොටුව, බේරුවල. | 6,283,642.51 |

**ඉහත සඳහන් ආයතන 02 මඟින් ඉදිරිපත් කර ඇති ලංසු පත් තාක්ෂණ ඇගයීම් කමිටු නිදෙර්ශය ලබා ගැනීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් නිදෙර්ශ කරන ලදී.**

**02.කසල වත්තේ කසළ තුනී කිරීම සඳහා චේන් ලෝඩරය ලබා ගැනිම.**

| අනු අංකය | ආයතනයේ නම | ට්‍රැක් ලෝඩරයේ වගර්ය / ධාරිතාව | බකට් එකේ පළල | පැයකට අයකරන මුදල | ප්‍රවාහන ගාස්තු |
|---|---|---|---|---|---|
| 01 | සුමුදු කන්ස්ට්‍රක්ෂන්, යටදොළ පාර, කීරන්තිඩිය. | මිට්සුබිෂී 3FBF 4000CC | අඩි 05 | 3000.00 | 5000.00 |
| 02 | නෙත්මි සප්ලයසර්, පන්සල හන්දිය, කාලවිල, බේරුවල. | මිට්සුබිෂී 3FBF 4000CC | අඩි 05 | 3200.00 | 5000.00 |
| 03 | ධම්මි සප්ලයසර්, පන්සල හන්දිය, කාලවිල, බේරුවල. | මිට්සුබිෂී 3FBF 4300CC | අඩි 07 | 2480.00 | 2800.00 |

**ඉහත සඳහන් ආයතන 03 මඟින් ඉදිරිපත් කර ඇති ලංසු පත් අතරින් අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති ධම්මි සප්ලයසර්, පන්සල හන්දිය, කාලවිල, බේරුවල යන අය වෙත ටෙන්ඩරය පිරිනැමීමට ටෙන්ඩර් මණ්ඩලය විසින් නිදෙර්ශ කරන ලදී.**

සභාපති - අල්හාජ් ඇම්.මසාහිම් මොහොමඩ් මැතිතුමා -
සභාපති, බේරුවල නගර සභාව

සාමාජික - එම්.ආර්.එම්.මුනව්වර් මැතිතුමා -
උප සභාපති, බේරුවල නගර සභාව

සාමාජික - ඇම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මැතිතුමා -
මන්ත්‍රී, බේරුවල නගර සභාව

සාමාජික - අහමඩ් දිල්සාත් මැතිතුමා -
මන්ත්‍රී, බේරුවල නගර සභාව

සාමාජික - එම්.එස්.මොහොමඩ් මුස්පිර් මැතිතුමා -
මන්ත්‍රී, බේරුවල නගර සභාව

**ඌ. සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම.**

**ඌ.1.** 2022 මාතර්ු මාසික වියදම් සාරාංශය **(ඇමුණුම 07)**

**ඌ .2.** 2022 මාතර්ු මාසික ආදායම් සාරාංශය **(ඇමුණුම 08)**

**එ. තව දුරටත් සභාව තීරණය කරන ලදුව න්‍යාය පත්‍රයට ඇතුළත් කර ඇති කරුණු**
(වෙනත් කරුණු)

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
මුස්පිර් මන්ත්‍රීතුමාගේ පියාණන්ගේ අභාවය වුනා. ඒ වෙනුවෙන් ශෝකය පලකරලා ලියුමක් යවන්න ගෙදරට.
සභාවට හැමදාම හැමෝම එන්න ඕනේ. ආණ්ඩු පක්ෂෙයි විපක්ෂෙයි කියලා නැහැ. මාසෙකට සැරයයිනේ එන්නේ. මොනවා තිබුණත් ඒකට එන්න ඕනා. අපේ මහජන සෞඛ්‍ය පරීක්ෂකතුමා නයනජිත් මහත්තයා ලිපියක් එවලා තියෙනවා ලේකම්තුමා මඟින් ඉන්ධන දීමනාව නැවත ලබා ගැනීම සම්බන්ධව. මේක දෙන්න ඕනේ. මේක දුන්නොත් තමයි ඒගොල්ලො කරන සේවාව අපිට ලබා ගන්න පුලුවන් වෙන්නේ. ප්‍රශ්නයක් තියෙනවා කොහෙන්ද හොයන්නේ පෙට්‍රල්. මන්ත්‍රීවරුන්ටත් ඩීසල්, පෙට්‍රල් ප්‍රශ්නේ තියෙනවා.

<u>**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**</u>
ඒ කාලේ මම තමයි ඒක ඒගොල්ලන්ට දෙන්න කියලා යෝජනා කරේ.ලීටර් දහය නම් ඒක දුන්නාම ඉවරයි.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
ඒ කියන්නේ මාසෙකට එක්කෙනෙක්ට ලීටර් 10 ද. මාසිකව 10 යි නේ. සාධාරණ ඉල්ලීමක්.
සියන් මන්ත්‍රීතුමා ලිපියක් එවලා තියෙනවා පාර ප්‍රතිසංස්කරණ කිරීම සම්බන්ධව. පිටවල මංසන්ධියේ ඉදලා ශේහුනප්පා මාවත හැරෙන හන්දියේ පාරේ කොටසක් අබලන් වීම සම්බන්ධයෙන්.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
පිටවල හන්දියේම තියෙන්නේ. ලොකු වලක්. ඒක හදනවද

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
අතුරු පාරද.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
පී.ආර්.ඕ මහත්තයා කියනවා නෝම්බියට හැදුවලු වෝටර් බෝඩ් එකෙන් ඊට පහුවෙනිදා ඇවිල්ලා. එස්.ඩබ්ලිව් මහත්තයා ශේහුනප්පා පාරේ වළක් තියෙනවලු වෝටර් බෝඩ් එකෙන් හාරලා.ඒකේ වතුර පිරිලා තියෙනවා.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඇත්තම කියනවා නම් ඒක මම දැක්කා. හැමතිස්සේම අපි හදන්නයි ඒගොල්ලන් ඇවිල්ලා කඩලා යන්නයි ඒක හරියන්නේ නැහැනේ. ඒකට පිළිවෙලක් තියෙන්න ඕනා සභාපතිතුමා. බලන්න දැන් කොච්චර කාලයක්ද. නෝම්බි ඉවර වෙලා මාසයක් නැහැනේ. ඒක හින්දා එක්කෝ ඒගොල්ලන්ගෙන් ගානක් අරන් හදන්න. හදලා මාසයක් නැහැනේ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
එස්.ඩබ්ලිව් මහත්තයා මේගොල්ලන්ගෙන් මේ ඩැමේජ් ගන්න ලියුමක් දාන්නේ නැද්ද ඩැමේජ් එක මෙච්චරයි කියලා.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
අනික මේක ඇතුලේ පේන්නේ නැති පාරක් නෙමෙයිනේ.

<u>**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**</u>
ඇත්තටම මේගොල්ලන්ව අපි ගෙන්නමු මෙහෙට. ගෙන්නලා ඔබතුමා කියන්න මේ පාරක් කැඩුවම අය කරන මුදලක් තියෙනවනේ. දැන් මේ මංගල පාරේ කාපට් එක දැම්මනේ. ඒක ආයෙත් කඩලනේ. ඒවා අය කර ගන්න ක්‍රමවේදයක් හදන්න කියලා. ඒගොල්ලන්ව කැඳවන්න ඔබතුමාටනේ බලය තියෙන්නේ. ඒ කට්ටිය ඔක්කොම කැඳවන්න. ටෙලිකොම් එකේ කට්ටියවයි, වෝටබෝර්ඩ් එකේ කට්ටියවයි හැමෝම ගෙන්වලා අපේ තියෙන මේ කොන්දේසි දෙන්න ඒගොල්ලන්ට. ලයිට් කණු කාණුවල තියෙන්නේ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
එක පාරට ඩැමේජ් එකක් ආවනම් ඒගොල්ලෝ ඉක්මනට කරනවා.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඒක ප්‍රශ්නයක් නැහැ. ඒගොල්ලන් කැඩුවට කමක් නැහැ ඩැමේජ් එක ගෙවන්න ඕනේ.

<u>**ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.එන්.ෆවුසුල් අමීර් මහතා**</u>
රවුෆ් මාවතෙත් යන්න බැහැ වලවල් හාරලා තියෙනවා වෝටර් බෝඩ් එකෙන්.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඒ වගේම තමයි පන්සල පාර. මම මෙතන ලියලා තියෙන්නේ එක පාරයි. හැම පාරම වගේ කඩලා තියෙනවා. මෙහෙමනේ දැන් ඉස්සර වගේ නෙමෙයි ගානත් වැඩියි දැන් හදන්න සල්ලිත් ඕනේ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
එදාට මන්ත්‍රීතුමන්ලත් එන්න. 26 වෙනිදා පෙ.ව.10.30 ට දෙපැත්තම කැඳවන්න.
<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>

ඒ වගේම හැම මන්ත්‍රීලටම පොඩ්ඩක් වෙලාව දැනුවත් කරන්න. ඒගොල්ලන්ගේ තියෙන පාරවල් ඔක්කොම බලාගෙන එන්න කියලා. අද ඇවිල්ලා තියෙන කට්ටිය හරි ආපු නැති කට්ටියට පොඩ්ඩක් කිව්වා නම් හරිනේ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
ටෙලිකොම් එකටයි, වෝටබෝර්ඩ් එකටයි අදම ගිහින් 26 වෙනිදට මේ පාරවල් කැඩීම පිළිබඳ සාකච්ඡාවක් තියෙනවා කියලා අනිවාර්යෙන් එන්න කියන්න.
සියාන් මන්ත්‍රීතුමා තව ලිපියක් තියෙනවා. මේ දීනගොඩ රවුෆ් හජ්ජියාර් මාවත අර ඉස්කෝලේ ළඟින් ඇතුළෙන් යන පාරද.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඔව් ඉස්සරහ හොඳ තත්ත්වයේ තියෙනවා. පිටිපස්සෙම තියෙන ටික සභාපතිතුමා. ඒ ටික පොඩ්ඩක් සුද්ද කරන්න ඕන. ඒ විතරක් නෙමෙයි සභාපතිතුමා දැන් වෂර්ාව කාලේ හින්දා හැම කාණුවක්ම සුද්ද කරන්න ඕනා. නැත්නම් පාර කැඩිලා යනවා වතුර හිටියොත්. ඒක හින්දා ඔක්කොම පොඩ්ඩක් බලලා හැදුවොත් හොඳයි සභාපතිතුමා.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
සෞඛ්‍ය අංශයේ පී.එච්.අයි මහත්වරු රැස්වීමට එන්නේ නැද්ද. මේ සභා තීන්දු ඒගොල්ලන්ට දැනුම්දෙන්නේ කොහොමද. කවුරු හරි එක්කෙනෙක් සභාවට සහභාගි වෙන්න ඕනනේ. තාරක මහත්තයට එන්න කියලා කියන්න. සභා රැස්වීම තියෙන දවසට අනිවාර්යෙන් ඒ ඒ අංශවලින් එක්කෙනෙක් එන්න ඕනේ. හදිසි අවශ්‍යතාවලට පිටට යන එක වෙනම කතාවක්. මේක තමයි මූලික. මෙතනින් තමයි සභාවේ කටයුතු කරනවද නොකරනවද මේක අයාලේ යනවද කියලා තීන්දු කරන්නේ මෙතනින්. මේකට ඒගොල්ලෝ එන්නේ නැත්නම් මූලික අවශ්‍යතාවයන් තියෙන කට්ටිය ආවේ නැත්නම් කොහොමද සභාව ගෙනියන්නේ. තාරක මහත්තයා දන්නේ නැද්ද අද රැස්වීම තියෙනවා කියලා. ලේකම්තුමා ඔබතුමාගේ වගකීම නිලධාරීන්ව මෙතනට ගෙන්න එක.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>
ඒගොල්ලන්ගෙන් එක්කෙනෙක් හරි එන්න කියන්න සභාපතිතුමා.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>
වැඩක් නැහැනේ මාසෙකට සැරයක් ඇවිල්ලා මෙතන ගන්න තීන්දු තීරණ ඒගොල්ලෝ දන්නේ නැත්නම් මොනවදට මෙතන ඉන්නේ. නැත්නම් මාසෙකට සැරයක් සභාව රැස්වෙලා ගන්න තීන්දු තීරණ වලින් වැඩක් වෙන්නේ නැහැ. ඒගොල්ලෝ ස්ථිර වශයෙන් දැනගන්න ඕනේ මාසෙකට සැරයක් අනිවාර්යෙන් මේකට සහභාගි වෙන්නට ඕනේ කියලා. ලේකම්තුමා ආවේ නැත්නම් කොහොමද මේක කරන්නේ. ඒ වගේම තමයි අනිත් කට්ටියත්. ඒක දැනගන්න ඒගොල්ලන්ට ලිඛිතව යවන්න. ඒගොල්ලන්ගේ ෆයිල් එකට දාන්න ලෙටර් එකක් එන්නේ නැත්නම්.
කෘෂිකමර් අමාත්‍යාංශයෙන් ලිපියක් ඇවිල්ලා තියෙනවා. හදිසි සැත්කමක් පිළිබඳ. මොකද්ද මේකට කරන්නේ. මේක පිනක්. වෙසක් වෙනුවෙන් කරගන්න පුලුවන් ලොකු පිනක්. ෆොටෝ එකකුත් එවලා තියෙනවා.
කල්ප ගාව දැන් අවරුදු එකහමාරක් දෙකක් වෙනවා ටේලර් එකක් දාලා අද හම්බුනේ නැත්නම් එතනින් ටේලර් එක ගන්න. දගර් ටවුන් එක්කෙනෙක් ඉන්නවානේ ගැරිජ් කරන කෙනෙක්. කවුරු හරි කමක් නැහැ අවුරුදු 02 ක් සෞඛ්‍ය අංශයේ කට්ටිය කැගහනවා වාහන නැහැ කියලා මේක අදින්න. අද හම්බුනේ නැත්නම් දගර් ටවුන් එකට ගිහින් දාන්න. එක ගැරිජ් බාස් කෙනෙක් තියාගත්තාම ඕක තමයි ලෙඩේ. දෙන්නෙක් තුන්දෙනෙක් තියාගන්න ඕනේ. දැන් ආයෙත් පොලිතින් වෙන්කරලා ගන්න ඕනේ. ඉතින් ඒකට අපි ගන්න තීන්දුව කියන්න පී.එච්.අයි මහත්තයා නැහැනේ. ඒ ටේලර් දෙක හම්බවෙනකන් කුණු වෙන් කරලා ගන්නේ නැද්ද. මොකද්ද ලේකම්තුමා ඒකට කරන්නේ. අනිවාර්යෙන් ඒක කරගන්න වෙයි. මහ කාණුව බ්ලොක් වෙලා තියෙනවා නම් ගලාගෙන යන්නේ නැහැ. ප්‍රියන්තව අයින් කරලා කොච්චර කල් වෙනවද. එයා බැනුම් අහගෙන හරි කරා. කොහොම හරි අපි ඇදගෙන ගියානේ. කොරෝනා ආවනේ කොරෝනා එකෙන් තමයි නතර වුනේ.
<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>

එයා නිකන් හිටියත් හරි අපි බැලුවේ නැති හින්දනේ ඒක වුනේ. මීට පස්සේ ඒ ඒරියා එකේ ඉන්න කට්ටිය ගිහිල්ලා බලන්න ඕනේ. ඇත්තම කියනවනම් මම වැඩක් කරානම් ඒකෙ කුලිය හම්බුනේ නැත්නම් වැඩක් නැහැනේ.

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා
නැහැ එයාට ලොකුම ප්‍රශ්නෙ වුනේ සිල්ලිය ඇළ සුද්ද කරද්දී එයා හරියට කරේ නැහැ එයා දාපු ගෝලයා. මීටරේ විතරක් දිව්වා මඩ මුකුත් ගත්තේ නැහැ. ඒකයි වුනේ.

ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා
එයාට පාඩුවෙන වැඩක් කරලා බැහැනේ.මම වැඩක් කරා නම් ඒකෙ කුලිය හම්බුනේ නැත්නම් වැඩක් නැහැනේ.

ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා
බාච් එක දාලා ඇළ මාගර් පිරිසිදු කරන කොට ගැඹුරට හාරන්න එපා කියන්න.

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා
මැනුවල් කරන්න බැහැ ඒක වෙන්නේ නැහැ. ඒක සාථර්ක නැහැ. ප්‍රියන්තට කියන්න අපේ ඇළ මාගර් 05 ක් තියෙනවා ඒ 05 ම සුද්ද කරන්න ඕනේ. අග්‍රාමාත්‍යතුමා තීන්දුවක් අරන් තියෙනවා සෞඛ්‍ය අංශයට , කමර්ාන්ත අංශයට තෙල් ගහන්න අත්‍යවශ්‍ය සේවාවලට ෂෙඩ් වලින් ගන්න කියලා.

ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා
මේ බේරුවල ෂෙඩ් එකට මුකුත් කරන්න බැරිද සභාපතිතුමා.

ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා
අපිට තෙල් නැති වුනානම් මන්ත්‍රීවරු බාගයයි ඇවිල්ලා ඉන්නේ. තව බාගයක් එන්න බැරුව ඉන්නවා. අනාගතයේදි තෙල් නැති වුනානම් අපි ZOOM එකෙන් හරි කරන්න ඒක සාථර්ක වෙයිද. මන්ත්‍රීවරු මාස 03 ක් සභා රැස්වීමට ආවේ නැත්නම් මන්ත්‍රිධුරය ඉබේම අහෝසි වෙනවා. අපි කැමති නැහැ එහෙම අහෝසි කරන්න. හරි ලබන පාර එහෙම ගැටලුවක් ආවොත් අපි සභාවෙන් වාහනයක් එවන්න අපි ලෑස්ති කරන්නම් උදේට.
මන්ත්‍රීතුමාලා, මම අර කිව්වේ ලෙඩ වුන කෙනෙක් ගැන. එයාගේ දුව ලියුමක් එවලා තියෙනවා අපේ ගරු මන්ත්‍රීතුමන්ලටත්, සභාවේ කට්ටියටත්. ටෙලිෆෝන් නම්බර් එකත් දාලා තියෙනවා. ලේකම්තුමා යෝජනා කරනවා එක්කෙනෙක් රුපියල් සීය ගානේ හරි දාලා අපේ සභාවේ නිලධාරීනුයි, මන්ත්‍රීවරුයි දාලා යවමු කියලා. ඔබතුමාලා කැමතිද ඒකට. පන්සීය ගානේ දාමුද මන්ත්‍රීවරු.
පී.එච්.අයි මහත්තයා, ලොකුම චෝදනාවක් සභා රැස්වීම් වලට සහභාගි වෙන්නේ නැහැ කියලා සෞඛ්‍ය අංශයෙන්. මෙතන සෞඛ්‍ය අංශයෙන් ගොඩක් ගැටලු තියෙනවා. මොකද ඉස්සරහට වහිනවා. වැස්සාම අපේ ඔක්කොම කාණු, ඇළ මාගර් 05 ක් තියෙනවා. ඒවා සුද්ද කරන්නේ නැතුව අවුරුද්දකට වැඩියි දැන්. දැන් ආයෙත් සුද්ද කරන්න කාලේ හරි. ඉතින් ඒ සම්බන්ධව සාකච්ඡා කරද්දි සෞඛ්‍ය අංශයේ අවශ්‍ය නිලධාරීන් මෙතන නැහැ. ඒ නිසා සභා රැස්වීම් දවසට අනිවායෙර්න් සහභාගි වෙන්න ඕනේ. ඒක හොඳට ඔළුවට ගන්න. මොකද, මෙතනින් ගන්න තීන්දු තීරණ තමයි සභා වපසරිය තුළ ඕගොල්ලෝ ක්‍රියාත්මක කරන්නේ. ඕගොල්ලොත් මෙතන නැත්නම් ඕගොල්ලොන්ට ඒ තීන්දු තීරණ එන්නේ නැහැ. ඕගොල්ලෝ දන්නෙත් නැහැ කොයි මන්ත්‍රීතුමාගේ ගැටලුද, කොයි පළාතෙද. කොයි කොට්ඨාශෙද, කොයි ඇළ මාගර්ද කියලා ඔබතුමාලා හිටියොත් තමයි දැනගන්න පුලුවන් වෙන්නේ. ඒක හින්දා කරුණාකරලා සහභාගි වෙන්න රැස්වීමට.
පී.එච්.අයි මහත්තයා, ඔබතුමාට සුභද ආරංචියක්. ලීටර් 10 ගානේ පෙට්‍රල් ඉල්ලලා දීලා තියෙනවා මාසෙකට. අපි අනුමත කරා. බලන්න මන්ත්‍රීවරු ඔබතුමාලත් එක්ක කොච්චර ලෙංගතුද කියලා. ඔක්කොම ඒකමතිකව ඒක ලබා දෙන්න කියලා සේවයට අවශ්‍යයි කියලා. ඒක ක්‍රියාත්මක කරන්න වෙයි. මොකද දැන් පෙට්‍රල්, ඩීසල් හොයා ගන්න එක තමයි අමාරු. දැන් ඊයේ අග්‍රාමාත්‍යතුමා

තීන්දුවක් අරන් තියෙනවා රාජ්‍ය ආයතනවලට අත්‍යවශ්‍ය සේවාවලට සමූපකාර ෂෙඩ් වලින් ගන්න කියලා. දැන් එතනට ඒගොල්ලන්ට ඒ බලය දෙන්න හදනවා. එතකොට අපිට ලේසියි.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>

බොහොම ස්තූතියි මේ සභාවේ මන්ත්‍රීවරුන්ට. අක්මා බද්ද කරන රෝගියා වෙනුවෙන් රු.14,000.00 ක් එකතු වෙලා තියෙනවා.

ගරු සභාවෙන් අවසරයි. මේ ඉන්ධන අපේ පී.එච්.අයි මහත්වරුන්ට දුන්නා වගේම ඉල්ලීමක් තියෙනවා අපේ එස්.ඩබ්ලිව් මහත්තයයි, පී.ආර්.ඕ මහත්තයයි ලොකු සේවයක් තියෙනවා අපේ සභාවට.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>

අලුත් වෛරස් එකක් පැතිරිලා තියෙනවා ගරු සභාපතිතුමා. අවුරුදු එකහමාර, දෙක අතරේ ඉන්න ළමයින්ට වෛරස් එකක්. ඒක ආවොත් තද උණක් එනවා. ඒක ගොඩක් ළමයින්ට තියෙනවා දැන්.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

හැමතැනම තියෙනවා.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.ඒ.එම්.අරූස් මහතා</u>

අපේ පොඩි පුතාටත් ඒ වෛරස් එක හැදිලා තියෙන්නේ. බෙහෙත් ගන්න ගියා කිසිම ෆාමසියක පැනඩෝල් පැනි නැහැ. පොඩි ළමයින් පැනඩෝල් පෙති බොන්න බැහැනේ සභාපතිතුමා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

අත්‍යවශ්‍ය බෙහෙත් වල අඩුපාඩුවක් තියෙනවා. පොඩි ළමයින්ට දෙන මේ බෙහෙත අත්‍යවශ්‍ය නම් සෞඛ්‍ය ඇමතිතුමාට අපේ සභා යෝජනාවක් අපි යොමු කරමු.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>

ගරු නගරාධිපතිතුමනි, මට ලියුමක් ඇවිල්ලා තියෙනවා. ඔබතුමාට ඒ ලියුම යොමු කරලා තිබුනා අපේ හිටපු වෙලින්ටන් ෆොන්සේකා මහතාගේ පුතා. එයා ඉල්ලලා තියෙනවා පිටිපස්සේ කඩේ කරන්ට් බිල එයාගේ නමට හරවන්න කියලා. එතකොට ඔබතුමා එවලා තියෙනවා සභාපති නමින් ඒ කරන්ට් එක ගන්න කියලා. අනිත් කඩවල්වල ඒ ඔක්කොම කරන්ට් එක ගන්නේ කඩේ අයිතිකාරයාගේ නමින් ඒ කඩවල කරන්ට් එක අරන් තියන්නේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

සභා ගොඩනැගිලිද.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>

පිටිපස්සෙ කඩ පේළියේ. එයා අහනවා ඇයි එහෙම කරන්නේ සභාපති නමින් මොකටද කරන්ට් එක ගන්නේ කියලා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>

ඒගොල්ලන්ට එහෙම දුන්නාම ඒක පැවරුවා වගේ වෙනවනේ.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>

ඒ වගේම තමයි අපේ පිටවල සොහොනේ මායිම වෙනස් කරලා මායිමක් ගහලා තිබුනා විස්ඩම් එකෙන්. කතා කරාට පස්සේ කිව්වා සජිත් බලන්න ගිහිල්ලා මන්ත්‍රීලා කට්ටියත් එක්ක කියලා. ඒ ප්‍රශ්නෙ මම විසඳගත්තා. ඒ වුනාට මට හිතෙනවා දැන් තාවකාලික විදියට තමයි ඒ අවස්ථාවේදි ඒක කරේ කම්බි කණු ගහලා. ඉතින් අපේ සභාවෙන් ලක්ෂ 05 ක වගේ මුදලක් යයි මායිම ගහලා වැටවල් ගහන්න බැරිනම් මායිමවත් අපි දාගමු කියලා. නැත්නම් මේ වැටවල් දුවනවා. මේක වෙලාවට පාරෙන් එහා පැත්ත වුනේ. නැත්නම් ඒක බලාගන්නම බැරි වෙනවා. මේක පාරෙන් වෙන් වෙලා තියෙන්නේ.

පාරෙන් වෙන් වෙලා කියන්නේ අඩි අටකවත් පාරක් නෙමෙයි තිබුනේ. දැන් ඒත් අපි අඩි 15 ක් විතර තියලා තමයි ඒ බැම්ම ගැහුවේ. මම යෝජනා කරනවා අපේ මේ සභා අරමුදලින් අපි පාර හැදුවා වගේ අපි ලක්ෂ 10 යි ගානක්ද කොහෙද ඒ දවස්වල වියදම් වුනානේ. දැන් අපිට ඒ බැම්ම හදලා දෙන්න කියලා. ඒ වගේම මැද. පල්ලිවල සොහොනකට ගියාට පස්සේ ඇත්තටම බලන්න ලස්සනයි. මොකද ඒවා ක්‍රමානුකූලව මේ පැත්ත අවුරුදු ගානක් යද්දි ඒ පැත්තේ බොඩීස් දිරන්නයි හදලා තියෙනවා. ලස්සනට ඒක නඩත්තු වෙනවා පල්ලියෙන්. ඒවගේ අපේ නගර සභාවෙ රජයේ සල්ලිත් තියාගෙන මිනිස්සුන්ගේ බදු සල්ලිවලින් අපි මේක කිසිම ලස්සනක් කරලා නැහැ. මම එදත් කිව්වා. මම ආදාහනාගාරය ගැන නම් කතා කරන්නේ නැහැ. මම ඉල්ලන්නේ ඒ මැදින් පාර ලස්සනට හදලා දීලා දෙපැත්තේ මල් ටිකක් වවලා දෙන්න. අර අපිට දෙහිවල නගර සභාවේ තියෙන නිසල සෙවණ වගේ සොහොන් වගේ එපා. දැනට අපි ආදාහනාගාරය ඉදි කරන එක එහෙමම තියලා දැනට තියෙන මාගර්ය අපි හරියට ලස්සනට හැදුවනම් දෙපැත්ත හරි. නගර සභාවෙන් දැන් ඉස්සර වගේ මුරකරුවොත් හිටියා. එහෙ අයත් දැන් අපි මෙහෙ දාලා. දැන් මුර අයත් නැහැ ඒකේ. ඔබතුමා ප්‍රාදේශීය සභාවේ මේනක සභාපතිතුමාට කතා කරලා කිව්වට පස්සේ කුණු ටික අයින් කරන්න කියලා කුණු ටික අයින් කරලා දාලා තියෙන්නේ නගර සභා සොහොන හාරලා සොහොන ඇතුළෙ වළලලා. ඒක කවුරුවත් අපේ නගර සභා කට්ටිය දන්නේ නැහැ මොකද්ද කරලා තියෙන්නේ කියලා. නගර සභවෙන් සොහොන හාරලා කුණු ටික ඔක්කොම දාලා වහලා. මිනිස්සු දන්නේ නැහැ .අපි මැරුණත් යන්න ඉන්නේ ඔතනට තමයි. ඒ නිසා ඒක ලස්සනට හදමු. මටනම් දැන් ආදාහනාගාරයක් එපා ඕකේ. කොහොමත් අපි වළලන මිනිස්සුනේ. මැදින් පාර අපිට ලස්සනට හදලා දෙන්න කොන්ක්‍රීට් කරලා හරි ගල් අල්ලලා හරි ලස්සනට හදලා දෙන්න. ලක්ෂ 15 ක් යයි අපි ඊට වඩා සල්ලි මේකෙ වියදම් කරනවානේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා**</u>

ගරු මන්ත්‍රීතුමා, සමාවෙන්න. සොහොන අපේ පල්ලියෙත් තියෙනවා. සාමාන්‍යයෙන් සල්ලි තියෙන මිනිස්සු දාලා තමයි ඕවා ලස්සනට හදන්නේ. මම නිකන් කියන්නේ ඔබතුමත් ලොකු සල්ලිකාරයා.ඒවගේ එකතු කරලා හදන්නකෝ ලස්සනට.

<u>**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**</u>

ඔබතුමා දන්නේ නැති වුනාට මගේ සල්ලිවලින් පස් කියුබ් 75 ක් දාලා පාර මම හැදුවා. මෙහෙමයි මේවා මිනිස්සුන්ගේ සල්ලි වලින්නේ නඩත්තු වෙන්නේ.

<u>**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**</u>

මෙතුමා තේරුම් ගත්ත විදිය වෙනයි. ඇත්තටම ඒක ඇවිල්ලා පොදු සුසාන භූමියක්. ඒක හින්දා මෙතුමා කියනවා වගේ අපි නගර සභාවට අයිතියිනේ.

<u>**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**</u>

නැහැ මම කිව්වේ ඕගොල්ලොන්ගේ තියෙන පිළිවෙල. අපේ කට්ටියට පිළිවෙලක් ඕනෙ නැහැනේ යන පාර තිබුනාම ඇති. ඕගොල්ලන්ගේ පල්ලිවලින් එහෙම නෙමෙයි ලස්සනට හදලා නඩත්තු කරගෙන යනවා. ඒක හොඳයි.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

මුස්ෆීර් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ පැහැදිලි කිරීම හරි.

<u>**ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා**</u>

අපි සභාවෙන් කරන එක කරමු. එදා ඉදන් කිය කිය යනවා මේ සොහොන හදන්න ඕන කියලා. ඒක තමයි මම මේ කියන්න හදන්නේ.

<u>**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**</u>

හරි මන්ත්‍රීතුමා, දැන් මෙතුමගේ යෝජනාව ඇවිල්ලා පිටිපස්සේ පාර කුණු දාලා එතන අපේ මායිම අපි වෙන් කර ගමු කියලා. ඒක හොඳ යෝජනාවක්. අත්තිවාරමක් දාමු. ඊට පස්සේ අත්තිවාරම උඩින්

තාප්පේ බැඳගමු. අනිත් එක මැද පාර. ඒ පාරේ එකමුතු මාවතට ගිහිල්ලා වැටෙන්න කොන්ක්‍රීට් කරන්න ඇස්තමේන්තු කරන්න එස්.ඩබ්ලිව් මහත්තයා.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>
පාරට සම්බන්ධ කරන්න බැහැ. ඇතුළට විතරයි. ඊළඟට නැත්නම් එතනින් පාරක් දැම්මොත් මිනිස්සු එන්න යන්න පටන් ගන්නවා. ඒක කරන්න දෙන්න බැහැ. එහෙම කරොත් නගරාධිපතිතුමා ලොකු ප්‍රශ්නයක් වෙනවා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
ඉතින් එතනට අපි ගේට්ටුවක් දාමු. එතකොට අපේ ආරක්ෂාවටත් එක්ක හොඳයිනේ.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>
ඔව් ඒක හරි. නගර සභාවෙන් පාලනයක් තියෙන්න ඕනා. නැත්නම් මිනිස්සු පාවිච්චි කරනවනේ. මොකද එතන තමයි යෝජිත වෙලා තියෙන්නේ ආදාහනාගාරය ගහන්න.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
නැහැ ආදාහනාගාරය හදන්න යෝජිත වෙලා තියෙන්නේ පාරේ වම් පැත්තට.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>
ඒ වගේම තමයි ඉස්සරහ ගේට්ටුව, ඒකට ලස්සනට ගේට්ටුවක් හදලා එතන කුණු නොදමන්න අඩුගානේ මල් වැටක් හරි හදන්න. දැන් එතන පොඩි පොඩි වෙළදාම් කරන කට්ටිය ඉන්නවා එළවළු, කීර එහෙම විකුණන අය.ඒ අයගේ රැකියාව නැති කරනවා නෙවෙයි. එතනත් ලස්සන පොඩි මල් වැටක් වගේ ලස්සනට හදන්න. ඔබතුමාට පින්සිද්ධ වෙනවා මේකට. මොකද, ඉතිහාසයේ ෆලීල් මහත්තයාගෙන් පස්සේ මේ සොහොනට උදව්වක් ඔබතුමා අපි වෙනුවෙන් කරන්න. ඒක ඔබතුමාගේ නම පවතින වැඩක්.

<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා</u>
එදා ඉඳන්, ඕගොල්ලොත් කියනවා, මේගොල්ලොත් කියනවා, අපිත් කියනවා සභාපතිතුමාට මේ සොහොන ගැන පොඩ්ඩක් බලන්න කියලා. සාමාන්‍යයෙන් අපේ පල්ලිවල නම් සල්ලි දාලා මොකක් හරි කරගන්නවානේ. මමත් මේ ළඟදි මළගෙදරක ගියානේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
එස්.ඩබ්ලිව් මහත්තයා, ඇස්තමේන්තුව ලබන සභා වාරයේදි ස්ථිර කරන්න.

<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා</u>
ඒක විතරක් නෙමෙයි. මෙතන බණ්ඩරවත්තේ සොහොනත් තියෙනවා. ඒකත් එහෙමයි.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>
අපි මුලින් එකක් ඉවර කරමුකෝ.

<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා</u>
සභාවේ සල්ලි නැත්නම් වෙනකාගෙන් උදව් අරන් කරනවනම් මමත් ඒකට උදව් වෙනවා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
මුලින්ම විස්ඩම් ඉස්කෝලේ පැත්තෙන් අත්තිවාරමක් දාන්න ඕනේ. නැත්නම් ඒගොල්ලෝ අපේ සොහොන අල්ලගන්නවා.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**
අනිත් එක සභාපතිතුමා,මේ සොහොන අපේ නගර සභවෙන් කරන සොහොනනේ. එහෙන් ආදාහනය කරන කට්ටිය මෙහෙන් අවසර අරන් ද යන්නේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
ඔව්.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**
එහෙනම් අපිට පුලුවන් මේක පිළිවලට ගේන්න.

**<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆිර් මහතා</u>**
අනිත් සභාව එන්න ඉස්සෙල්ලා මේක පටන් ගන්න ඕනේ. නැත්නම් කිය කිය ඉදලා කල් යනවා. දැන් මේක කී පාරක් කිව්වද.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
අපේ එස්.ඩබ්ලිව් මහත්තයයි, ටී.ඕ මිසුයි ගිහිල්ලා ඇස්තමේන්තු කරා නේද ළඟදි. ඇස්තමේන්තු කරාට කොන්ත්‍රාත්කාරයා දීපු ගාන වැඩියි.

**<u>ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා</u>**
මම කිව්වේ නගර සභාවේ අනුමැතිය මෙහෙන්නේ දෙන්නේ. දෙනකොටම කියන්න ඕනේ මෙතන තමයි හදන්න ඕන කියලා. එහෙම පිළිවෙලට කරන්න ඕනේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
එදා අපි කරන්න බැලුවා ඔය තාප්පේ පෞද්ගලික අයතනයක මුදලාලි කෙනෙක් අල්ලලා. සෙහොනෙ තාප්පේ හදලා දෙන්න එයා පොරොන්දු වුනා. ඊට පස්සේ කොරෝනා ආවා. කොරෝනා ආවට පස්සේ ඒක නතර වුනා. නමුත් අපි ඇස්තමේන්තුව භාර දුන්නා කොන්ත්‍රාත්කරුවෙකුට. එතකොට එයා කියපු ගානෙ හැටියට අපිට උහුලන්න බැහැ. ගාන වැඩි වෙනවා. එයාටත් ගාන වැඩිවෙනවා. පහකින් විතර කරන්න බැහැ අමාරුයි.

**<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>**
බ්ලොක් ගල් ටික මම හොයලා දෙන්නම්.මුලින්ම අපි තාල්පෙන් පටන් ගමු.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
මට සහයෝගය දුන්නොත් මට මේ වැඩේ පටන් ගන්න පුලුවන්. වෙසක් එකටත් කට්ටිය දාලා සුද්ද කරා.
මෙතන සජිත් මන්ත්‍රීතුමා හොඳ මාතෘකාවක් මතක් කරා. බේරුවල අපේ මුස්ලිම් පල්ලිවල ආදාහනාගාරය ලස්සනට, පිළිවලට තියාගන්නවා කියලා. ඒකෙ ප්‍රධාන හේතුව තමයි සොහොන් කොත් බදින්නේ නැහැ. සොහොන් කොත් බැන්දාම දෙසීය ගානක්, තුන්සීය ගානක්, දාහක් වුනත් සොහොන් කොත එතනමයි. දැන් මුස්ලිම් ක්‍රමයට ඇවිල්ලා වැළලුවා එතන පස් දැම්මා එච්චරයි. එතකොට මාස 06 ක් යනකොට එතන තව මිනියක් වළලන්න පුලුවන් විදියට ඒ ඇට ටික දිරලා යනවා. ඒක තමයි ක්‍රමය ඒ ක්‍රමයට කරන් යනකොට එක පේළියට කොයි කවුරු මැරුණත් ඒ පේළියට තමයි දාගෙන යන්නේ වෙන මැද්දට දාන්නේ නැහැ. එහෙම දාගෙන ඇවිල්ලා තමයි අනිත් පැත්තෙන් දාගෙන යන්නේ. එතකොට මේ පැත්තෙන් වළලනකොට එහා පැත්තෙන් දිරලා. ඒ වළවල් බැහැලා. එතකොට අයිත් පස් දාලා වළලන්න පුලුවන්. ඉතින් ඒ ක්‍රමය තමයි අපේ නගර සභාවලට මීට අවුරුදු 40 කට පෙර යෝජනා වුනා සොහොන් කොත් බඳින්න එපා කියලා. සොහොන් කොත් සම්පූණර්නේම තහනම් කරලා ඒ බෂ්මාවශේෂ තාප්පෙට ගහන්න. එයාගේ ෆොටෝ එක දාලා ගහන්න. ඉතින් ඒක සමහර තැන්වල ක්‍රියාත්මකයි. ඒ වගේ ක්‍රියාත්මක කරන්න අපි පටන් ගන්න ඕනේ.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
ඒක ප්‍රාදේශීය සභාවේ ක්‍රියාත්මක වෙනවා. ඒක හැබැයි පිළිවෙලයි.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>
අපේ හරි පාරක් නැහැනේ. අර පැත්තෙන් ගිහිල්ලත් වළලනවා. ඒ නිසා තාප්පයක් ගැහුවාම සීමාවට ඉස්සරහ තාප්පෙන්නේ යන්නේ. එතකොට ගේට්ටුවේ යතුර අපි ගාවනේ තියෙන්නේ. අපේ එක්කෙනෙක් ඉන්නවා ඒ සම්බන්ධවම.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
ගේට්ටු 02 ක් දාලා පිළිවෙලකට ගමු. හැබැයි අපේ ඥාතියෙක් මළා, අපේ සහෝදරයෙක් මළා කියලා මේකට සොහොන් කොත බැඳගන්න අවසර දෙන්න කියලා විතරක් ඉල්ලන්න එපා.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
නගරාධිපතිතුමා, මං හිතන්නේ අලුත්ගම ප්‍රාදේශීය සභාවෙන්නම් කරන්නේ අපි ප්‍රාදේශීය සභාවට දැනුම් දෙන්න ඕනේ අපිට කුටියක් ඕනෙ කියලා හරි වළලනවනම් එහෙම හරි කියලා. එතකොට ඊට පස්සේ අපි ලේකම්තුමාට ලියුමක් මාගර්යෙන් දැනුම් දීලා යම් ගානක් ගන්නවා. මං හිතන්නේ හයදහස් ගානක් වගේ මුදලක් කුටියක්. එතකොට ඊට පස්සේ තමයි අපි ගිහිල්ලා එතන ටයිල් කරලා හරි පින්තූර දාලා හරි හදන්නේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
ඔව් ටයිල් කරලා දාන්නේ තාප්පේ. ඒකෙ නිශ්චිත ප්‍රමාණයක් තියෙනවනේ.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
ඒ කුටි හදලා තියෙන්නේ සභාවේ සල්ලි වලින්.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
නියමයිනේ. එහෙනම් අපිට වටේටම තාප්පේ ගහලා අපි එක්කෙනෙක්ගෙන් රුපියල් පන්දාහක් හරි අය කරානම් ආදායමක් එනවනේ.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
එතකොට නගරාධිපතිතුමා, අපිට සභාවට ආදායමක් අරගෙන සම්පූණර්යෙන්ම අර සජිත් මන්ත්‍රීතුමා කිව්වා වගේ ඔටෝමැටිකලි ලස්සන කරගන්න ඕන නම් ඒ ටිකත් කර ගන්න පුලුවන්.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
හරි වළලනවා විතරයිනේ.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
නැහැ වළලනවා නෙමෙයි කුටි වගේ ගහනවා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
හරි කුටි ගහන්නේ තාප්පෙ භෂ්මාවශේෂ. ආදාහනය කරන්නේ නැහැනේ දැන් අපි.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
දැන් මෙහෙමනේ නගරාධිපතිතුමා, අලුත්ගම හරි, පයාගල හරි අපි පුච්චලා ගේනවනම් ඒ අලු ටික සමහර වෙලාවට අපි බේරුවල එක්කෙනෙක් නැති වුනා නම් මෙහෙ සොහොනෙනේ ගොඩක් වෙලාවට තැන්පත් කරන්නේ. එතකොට අර වගේ කුටි හදලා තියෙනවනම් එතකොට ඒකෙ තැන්පත් කරන්න පුලුවන්. මොකද අපිට කුටි ටික හදන්න විතරක් යන්නේ. ඒගොල්ලෝ තමයි ටයිල් කරලා ඔක්කොම කරගන්න ඕනේ.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
නැහැ වලළන්න පුලුවන්. කොන්ක්‍රීට් දාලා හදන්න පුලුවන් ඒ කට්ටිය ඒගොල්ලන්ගේ ඥාති කට්ටියගේ වළවල් පාවිච්චි කරනවා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ගරු මන්ත්‍රීතුමා, මේ පාර ආපු ගමන් අපි වැඩට බැස්සේ මුලින්ම සොහොනටනේ. එහෙනම් යෝජනාව ස්ථිරද. කරමුද එහෙනම් එහෙම. මුලින්ම පාරයි, තාප්පෙයි. ඒක පටන් අරන් දෙපැත්තෙන් ඉස්සරහට ගේට්ටු දෙකයි.

**ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්හීර් මහතා**
සොහෙන ඉස්සරහ කුණු දාන එක නැවැත්තුවද.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
කොච්චර නැවැත්තුවත් ඇවිල්ලා දානවා. බොඩ් දැම්මත් වැඩක් නැහැ.ලේකම්තුමා කියනවා සතියකට වතාවක් දැන් කුණු ගන්නවාලු.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**
බෝඩ් එකක් හරි ගහන්න.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
බෝඩ් ගැහුවට වැඩක් නැහැ. ඕක නවත්තන්න බැහැ. මොනවද කරන්නේ. ලේකම්තුමා කියනවා සතියකට සැරයක් සභාවෙන් ගන්නවලු. ඕක ළඟදි වුන දෙයක් නෙමෙයි. ඒ කාලේ ඉදලා මිනිස්සු කුණු දානවා. ප්‍රාදේශිය සභාවෙන් අයින් කරනවා. මම මේ හතරවෙනි පාර ඉන්නේ. කවදාකවත් අපි අයින් කරේ නැහැ.

**ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා**
නගරාධිපතිතුමා, ඒ වගේම තමයි බේරුවල ඔරලෝසු කණුව හදන්න ඒක අයිත්.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
එස්.ඩබ්ලිව් මහත්තයා, ඔරලෝසු කණුව වැඩ කරන්නේ නැහැ. මාස 06 යිනේ ඒගොල්න්ගේ වගකීම. අපි ඒගොල්ලන්ව ගෙන්නමු. ගෙන්නලා හදා ගමු.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**
සභාවෙන් අවසරයි, සභාපතිතුමා කියනවා අනිත් ගම් පළාත්වල සොහොන එච්චර ලස්සනට තියාගන්නවා කියලා. අද තීන්දුවක් අරන් තියෙනවා. ඒ තීන්දුව ක්‍රියාත්මක කරන්න ඔක්කොම සහයෝගය දෙන්න. එස්.ඩබ්ලිව් මහත්තයා, දැන් මෙතන කලිනුත් කතා කරා වැඩේ වුනේ නැහැ.ඒක ඇවිල්ලා ප්‍රධාන සොහොන බේරුවල.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ඔය ඉඩම දුන්නේ එෆ්.ආර්.ප්‍රනාන්දු මහත්තයා.

**ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**
මං හිතන්නේ ඔබතුමා පත් වුන ගමන් මුලින්ම කරේ සොහොන බලන්න ගිය එක.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ඔව් ඒකට තමයි මුලින්ම ගියේ.

**ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය**
ඔතන කුඩු ගහන කට්ටිය එහෙම ඉනන්වා කියලා මේ සභාවෙත් කතා කරලත් තිබුනා මමයි, පත්මකාන්ති මන්ත්‍රීතුමියයි.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**
තව එකක් තියෙනවා කුණු දාන එක අනිවායෙර්න් නවත්තන්න ඕනේ ඒකට බෝඩ් එකක් හරි ගහලා. ඒක නවත්තන්නේ නැතුව ඇතුළ මොනවා ලසස්න කරත් වැඩක් නැහැ.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
මට අර බිලාල් කියලා නිදහස් දිනය දවසේ ඇවිල්ලා අපිත් එක්ක ගස් ඔක්කොම බෙදුවේ දීනගොඩ සංවිධානයක් ඒගොල්ලෝ භාර ගත්තා ඒගොල්ලෝ කරන්නම් කියලා.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**
මොනවද ඒගොල්ලෝ කරන්නේ එතන.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ඒගොල්ලෝ සුද්ද කරලා වැට ගහලා, මල් ගස් හිටවලා ලස්සන කරලා ඒගොල්ලන් භාර ගන්නවා තාප්පෙටත් තීන්ත ගානවා. එහෙම සංවිධානයකට දුන්නා නම් ඒගොල්ලෝ කරයි.

**ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා**
අපි ලස්සනට හැදුවට වැඩක් නැහැ. එතන ඇවිල්ලා කුණු දානවනම්.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**
පාරවල් කඩලා තියෙනවා. කාණු තියෙනවා ඒක හදන්න එස්.ඩබ්ලිව් මහත්තයාට, මෙහෙ සුපවර්යිසර් අයට කෝල් කරලා කිව්වානම් මෙහෙ බඩු නැහැ කියලා කියනවා.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ආදායම අඩුයි.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**
කාගෙන්ද බඩු ගන්නේ. බඩු ගන්න අයට ගෙවලද තියෙන්නේ.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
ගත්තට වඩා දෙගුණයක් මිල වැඩි වෙලා.

**ගරු මන්ත්‍රී - එම්.එම්.එම්.සියාන් මහතා**
මෙහෙමයි. ඒක ඉතින් වැඩියි කියලා බලන් ඉන්න බැහැනේ සභාපතිතුමා. ඒකට ඉතින් මොනවද කරන්න පුලුවන් කියලා සොලුයුෂන් එකක් බලමු. හැමදාම අපි කතා කරලා යනවා විතරයි.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
කාටවත් පොරොන්දු දෙන්න එපා හදන්නම් කියලා.

**ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා**
අර කුණු වත්ත ප්‍රශ්නේ සර් අපිට හෙවි ප්‍රොජෙක්ට්ස් මුකුත් කරන්න බැහැ. ඒහෙම තත්ත්වයක අපි ඉන්නේ. තියෙන කුණු ටික දිගටම දාන්න ක්‍රමයක් නැද්ද. ඩීසල් ප්‍රශ්නෙ තියෙනවා. ටෙලර් ප්‍රශ්න තියෙනවා. අපේ පැත්තට කුණු ගන්න දවස් 10 ක් වගේ ආවේ නැහැ.

**ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා**
අපේ මේ කුණු වෙන් කරලා ගන්න කියන්න. නැත්නම් කුණු වත්ත ආයෙත් පිරෙනවා. ඔක්කොම ගිහින් කාණු ඇහිරෙන්නේ ඒකයි. පී.එච්.අයි මහත්තයා සේවකයන්ට කියන්න කුණු ගන්නකොට වෙන් කරලා ගන්න කියලා. මොකද මේ ඩෙංගු, කොරෝනා හින්දා හිර වුනානේ. සුමානයක් දෙකක් එක පාරකින් ගන්න බැරි වුනා. දැන් ඒකෙන් ආයෙත් හිරවුනා. පල්ලිවලට ලියුමක් යවන්න ආයෙත්

කුණු වෙන් කරලා ගන්නවා කියලා. හැබැයි එස්.ඩබ්ලිව් මහත්තයා ටේලර් එක අරයා ගාව තියෙන එක ගන්න. ඒක අරගෙන ගිහිල්ලා අදම ඒක කරන්න.

<u>ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා</u>
අනිත් එක මෙහෙමයි. අපේ නගර සභාවට හොඳ නමක් තියෙනවා. ආණ්ඩුවට බනිනකොට අපේ නගර සභාවට බනින්නේ නැහැ. අපි ලස්සනට කරලා තියෙනවා. ඒගොල්ලෝ දන්නවා දැන් නගර සභාවේ සල්ලි නැහැ කියලා. ලොකු ලොකු ප්‍රොජෙක්ට්ස් කරන්න. මේවගේ පොඩි පොඩි බලාපොරොත්තු තමයි තියෙන්නේ. ට්‍රැක්ටර් යන්න ඕනේ. පොඩි පටු ගෙවල් තියෙනවා ඒගොල්ලන්ට කුණු තියන් ඉන්න බැහැ මුහුදට විසි කරනවා. මේ වගේ ලොකු ප්‍රශ්න තියෙනවා.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
ඒ ගැන තමයි මේ මන්ත්‍රීතුමා කතා කරේ.

<u>ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා</u>
අපේ AC එකට මොකද වුනේ සර්.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
එස්.ඩබ්ලිව් මහත්තයා මොකද ඒකෙ තත්ත්වෙ.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>
AC එක එක මට භාර දෙන්න AC එක හදලා සතියකින් භාර දෙන්නම්. කට්ටිය ඉන්නවා. නැත්නම් අලුතින් AC පහක් ගෙනල්ලා හයිකරන්න පුලුවන්.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
අද සභාවේ තීන්දුවක් ගත්තා කල්පගේ ගැරිජ් එකේ දාලා තියෙන වාහන ඔක්කොම ගිහිල්ලා දගර්ා ටවුන් දාන්න. හරි එයාට පණිවිඩය කියන්න අද ඔක්කොම ගන්නවා කියලා.

<u>ගරු මන්ත්‍රී - අහමඩ් දිල්සාත් මහතා</u>
ඒ වගේම තමයි මාළු මාකර්ට් එකේ තියෙන ජිම් එක. ජිම් එකේ මොනවද අලුත් තොරතුරු.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.එන්.ෆවුසුල් අමීර් මහතා</u>
ර්ළඟ එක පන්සල පාර. ඇක්ලන්ඩ් මන්ත්‍රීතුමාගේ පන්සල පාරත් එහෙමයි.ඒ වගේම මරදාන බජාර් එකේ තියෙන

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
පොඩ්ඩක් එස්.ඩබ්ලිව් මහත්තයව දැනුවත් කරන්න. අපි එක පාරක් වන්වේ කරන්න ගියා. එතන පොලිසිය ගෙන්නලා ෆොන්සේකාට ගානක් දීලා අපේ වන්වේ බෝඩ් ඔක්කොම ගැලවලා තිබුනා.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.එන්.ෆවුසුල් අමීර් මහතා</u>
එයාට එහෙම අයිතියක් නැහැ. .

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
පොඩ්ඩක් බලලා මේක වන්වේ කරලා දාන්න.

<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>
ගරු නගරාධිපතිතුමා, චෝදනාවක් තියෙනවා මිනිසුන්ගෙන්. ගිය සෙනසුරාදා නගර සභා පරිශ්‍රය ආශ්‍රිතව අර ගෑස් දෙන්න ගත්තනේ. එතකොට බේරුවල නගර සභාවේ ට්‍රැක්ටරේ ඒවා තිහක් ගෙනිච්ච කතාවක් තියෙනවා. ඇත්තද නැත්තද දන්නෙ නැහැ. මොකද්ද ඒකෙ ඇත්ත තත්ත්වය කියලා තමයි දැනගන්න ඕනේ.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>
අපි සභාපතිතුමාගේ ඉල්ලීමට මජරින් ෆලීල් පාලරීමේන්තු මන්ත්‍රීතුමා ඕගනයිස් කරලා වෙයාමර්න්ට කතා කරලා සභාපතිතුමාගේ ඉල්ලීමට තමයි ඒක ලැස්ති කරේ 1000 ක්. ඒක ලොකු සේවයක්. ඒ කියන්නේ ජනතාව අරන් ගිය කට්ටිය, ගන්න බැරි වෙච්ච කට්ටිය කිව්වා. මේක මාස දෙකකට වැඩිය ඉදිආප්ප, ආප්ප හදන දුප්පත් ගෙවල්වලින් අපිට කෝල් එනවා. අපිට ගෑස් ටිකක් සපයලා දෙන්න අපිට රස්සාව කරගන්න බැහැ කියලා. එච්චර දුක් විඳින නිසා එතුමා මැදිහත් වෙලා නගර සභාවට ගෑස් 1000 ක් පටවලා අපේ ගම්පළාත්වල පරණකඩ පාරේ යන්නත් බැහැ, මරදාන පාරෙත් යන්නත් බැහැ, මහගොඩ යන්නත් බැහැ, දීනගොඩ යන්නත් බැහැ. එතකොට අපි කිව්වා නගර සභාවෙන් වැඩේ කරමු කියලා. එතකොට ඔබතුමියලා දන්නවා පහුගිය දවස්වල ගෑස් දෙන්න කියලා ගෑස් 150 කට වැඩිය නිකන් මිනිස්සු උස්සගෙන ගියා. එතකොට මුලින්ම මම මජරින් මහත්තයාට කිව්වා අපිට මුලින්ම මේක යවන්න ඉස්සෙල්ලා අපිට උදව් කරන්න කියලා. ඒ වගේම අපේ නගර සභාවේ ඉන්න නිලධාරිවරු මෙතනට උදව් කරගෙන හිටියා. වෙච්ච සිද්ධිය මුල ඉඳලම මම දන්නවා, පී.ආර්.ඕ.මහත්තයා දන්නවා, ස්ටාෆ් එක දන්නවා. නොදන්න අයට දැනගන්න මම කියනවා.පොලීසියේ ඉන්න නිලධාරීන්ටත් ගෑස් නැතිව ඒ අයත් රාජකාරී කරන්නේ අමාරුවෙන්.පොලීසියේ මෙස් එකේ ගෑස් නෑ.අපේ මෙතන ඉන්න ප්‍රධාන නිළධාරීන්ට ගෑස් ටැංකි 15 ක් වෙන් කළා.පොලීසියේ නිලධාරීන්ට වෙන් කළා.ජනතාව දුක් විඳින වෙලාවේ තමයි ඒ වීඩියෝ එක දාලා තියෙන්නේ.පොලීසියේ ටැංකි ටික ඒ වෙලාවේ ආපු එක තමයි ගැටළුව උනේ.

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
පොලීසියේ ටැංකි ටික ට්‍රැක්ටරයක පටවල මෙතන පිටිපස්සට ගෙනාපු එක තමයි වැරදි උනේ.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>
ඒ ගෑස් ගෙනා ටේලර් එකට ලක්ෂ 50 යි.ඒ සල්ලි පෙට්ටියට පොලීසියේ තුන් දෙනෙක් ආරක්ෂාව දුන්නා.එක ගෑස් ටැංකියක් ගන්න කිහිප දෙනෙක් ඇවිත් ඉන්නවා.මෙතනට ඒ නිසා ලොකු ආරක්ෂාවක් දෙන්න ඕන.පොලීසියට විරුද්ධව මිනිස්සු කෑ ගහන නිසා ඒ පොලීසියේ ගෑස් ටැංකි 24 තමයි එහෙම ගත්තේ.

**සභාවේ සෝෂා**

<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>
චේතනාව හරි .ක්‍රමවේදය වැරදිය.

<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා</u>
මම සභාපතිතුමාට කෝල් එකක් දීලා ඇහුවා.මෙතන ප්‍රශ්නයක් වෙනවා කියලා.එතකොට සභාපතිතුමා කිව්වේ අපි ඉඩම විතරයි දීලා තියෙන්නේ කියලා.

<u>ගරු මන්ත්‍රී - අල්හාජ් එම්.එන්.ෆවුසුල් අමීර් මහතා</u>
අපේ ස්ටාෆ් කියලා පිටින් දෙන්නෙක් තුන්දෙනෙක් අරන් තියෙනවා.

<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>
එහෙම කරානම් කවුරු හරි වැරදියි.

<u>ගරු මන්ත්‍රී - එච්.සජිත් දේවප්‍රිය සිල්වා මහතා</u>
මේක නගර සභාවේ සල්ලි වලින් දීපු එක්ක නෙවෙයිනේ.ඒ නිසා කාටවත් මේකට මුකුත් කියන්න බැහැ.1060 ගන්නවා කියලා අපි 60 ක් ගත්තා කියලා කාටවත් මුකුත් කියන්න බැහැ.මජරින් මහත්තයා මේක ගෙනුනුවේ නැත්නම් ඒකත් නැහැනේ.අපිටත් ගෑස් නැතිව තමයි මේක සංවිධානය කළේ.මේක කඩා කප්පල් කරන්න කට්ටිය නොයෙක් දේවල් කරනවා.

**<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>**
මේ වැඩ පිළිවෙළට ගොඩක් අකමැති පොඩි ඒජන්ට්ලා.ඒ අයට කරන්න බඩු නෑ.ඒ අයම වොයිස් කට් දානවා .වීඩියෝ දානවා.

**<u>ගරු මන්ත්‍රිනී - එච්.කේ.හේමාලි ප්‍රසංගිකා ප්‍රනාන්දු මෙය</u>**
ඇත්තටම් උප නගරාධිපතිතුමා ඒක ඕගොල්ලෝ විධිමත් විදිහට සැළසුම් සහගතව කළා නම් මිනිස්සු මේ තරම් මෙතන පිරින්නේත් නෑ.එන්නේ 1000 යි නම් 2000 ක් ගෙන්නලා වැඩක් නෑ.

**<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>**
අපි ඒ තරම් පිරිසකට එන්න කිව්වේ නැහැ.ආවට පස්සේ තමයි කියලා තියෙන්නේ මෙතන 1000 යි තියෙන්නේ.වැඩිපුර කට්ටිය ඉන්නවා නම් යන්න කියලා.සමහරු කැමැත්තෙන් හිටියේ.

**<u>ගරු මන්ත්‍රි - එම්.එස්.මොහමඩ් මුස්පීර් මහතා</u>**
මේ නිසා නම කැත වෙන්නේ ඔබතුමාගේ.මිනිස්සුන්ට දෙන ටික දීලා නගර සභාවට ගන්න ටික ඉතුරු කර ගත්තානම් හරි.වෙනම බෙදන්න ගිය නිසා තමයි ගැටළුව.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
සමහරු රුපියල් 5000 ට ගෑස් එක අරගෙන ලොකු ගන්න වලට විකුණනවා. ඒක වෙන්න සෙන් හොඳනෑ. මම කිව්වා මීට පස්සේ නගර සභාවේ ගෑස් බෙදන්නේ නැතිව බීච් ග්‍රවුන්ඩ් එකේ බෙදන්න කියලා.අපි මිනිස්සුන්ට හොඳ කරන්න ගිහිල්ලා මිනිස්සුන්ගෙන් නරක නාම ගන්න වෙන්නේ.

**<u>ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා</u>**
මේ දවස් වල රටේ තියෙන ගැටළුත් එක්ක ගමේ ජනතාවට වගේම නිළධාරීන්ටත් රටේ තියෙන ගෑස් ප්‍රශ්නයට ,ඉන්ධන ප්‍රශ්නයටත් හැමෝටම මුණ දෙන්න වෙනවා.අපි සියළු දෙනා ප්‍රාථර්නා කරන්න ඕන මේ ලෝකේ දියුණු වෙච්ච රටක් විදිහට ඉදිරියට යන්න ඕන කියලා. මේ රට හොඳට තියෙන්න ඕන අපිට ජීවත් වෙන්න.ඇතුත කතා කරන්න ඕන අවුරුදු 75 ක් තිස්සේ සමහර දේශපාලඥයේ විසින් කරපු දේවල් තමයි මේ. මේක එක පක්ෂයකට.එක පුද්ගලයෙකුට ඇඟිල්ල දික් කරන්න බැහැ.දැන් අපිට උනත් ජීවත් වෙන්න අමාරුයි. දවසට කුලී වැඩ කරන අයටත් ජීවත් වෙන්න අමාරුයි.දැන් තියෙන ප්‍රශ්න වලට තව ප්‍රශ්න ඇති නොවන විදිහට වැඩ කරන්න ඕන. එදා අපේ නිළදාරින් අපිත් එක්ක එකට වැඩ කරපු සේවක මහත්වරු ගොඩක් අපහසුතාවයට පත් උනා.
මේ දවස් වල හැම තැනම කාණු කැඩිලා. පාරවල් කැඩිලා. අපිටත් සල්ලි නෑ. ආණ්ඩුවටත් සල්ලි නෑ.
පිටවල සොහොනේ තියෙන ප්‍රශ්නය තමයි එතන ඉස්සරහ කුණු දානවා ඒක නවත්තලා ඒකෙට ගේට්ටු දෙකක් දාලා මල් ගස් ටිකක් හිටවලා ඒක ලස්සන කරන්න කියලා මම ඉල්ලනවා.අපි පොඩියට මේ ප්‍රශ්න වලට උත්තර හොයන්න ඕන.
පිටවල පාරෙයි,නබවියා පාරෙයි ,මේ තැපැල් කන්තෝරුව ඉස්සරහ පාරෙයි තියෙන්නේ එකම ගැටළුව.එතන වතුර ටික එකතු වෙන එක නතර කරන්න සපත්තු කාණු වක් හරි දාන්න.ඒ වගේම හදිස්සියට සභාපතිතුමාගෙන් අවසර ගන්නත් වොටර් බොඩ් එක පාරවල් කඩලා ඒගොල්ලෝ වැඩ කරනවා .හදිස්සි වතුර ලීක් එකකදී ඒගොල්ලෝ සභාපතිතුමාගේ අවසරය ගන්නේ නැතිවම ඒක හදනවා ඒ අවශ්‍යතාවයට.ඒකට ඒගොල්ලෝ යම් වියදමක් කරන්න තියෙනවා නම් අපිට කරන්න ඕන.ඒක ඒ අයටම වියවදම් කරලා කරන්න කියන්න. ඒ වගේ ක්‍රම වේදයක් තියෙනවද සභාපතිතුමා.ඒ වගේම එක කොන්ත්‍රාත්කරුවෙක් අරගෙන සබ් කොන්ත්‍රාත්කරුවෙකුට දෙනවා.එතකොට වැඩේ ප්‍රමාද වෙනවා.ඊටත් වැඩ උදේටත් වැඩ කිසිම පිළිවෙලක් නැහැ.
ඒ සී එක හදන්න ගොඩක් කල් අරගෙන කොරෝනා ප්‍රශ්නය නිසා අපිට ඒක තේරුනේ නැහැ.අපේ එස්.ඩබ්ලිව් මහත්තයා ,ආර් අයි මහත්තයයිඅපෙන් ඉල්ලීම් කරලා තියෙනවාඒ අයටත් ඉන්ධන ලබා දෙන්න කියලා.දැනට හරි ඒ අයට දෙන්න පුළුවන් ක්‍රමයක් තියෙනවා නම් ඉන්ධන ලබා දෙන්න කියලා මම ඉල්ලනවා.

මගේ කොට්ඨාසටයේ ෆලීල් මහත්තයාගේ ගේ ඉස්සරහ වැඩේ ඉක්මනට පටන් ගන්නවානම් හොඳයි. ඒ අය මගෙන් නිතරම අහනවා.

__ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා__
ගරු සභාපතිතුමනි,සියළුම මන්ත්‍රිවරුන්ගෙන් අවසරයි.ඔබතුමාට චන්ද්‍රපාල මහත්තයා සිරිනිවාස පාර සම්බන්ධයෙන් .දැන් මාස 06 ක් විතර වෙනවා.ඒ අය ඔබතුමාලත් එක්ක අවුරුදු ගානක් ලඟින් ආශ්‍රය කරපු අය.අපිත් එක්ක ඔබතුමාව අගය කරනවා.අපිට දැන් මෙහෙමයි කරන්නේ කියලා.මම කිව්වා මේක පී ආර් ඩී ඒ එකේ පාරක්. එතකොට ඒ අය අහනවා. අපෙන් බදු අය කරනවා. පාරවල් කැඩුනම නගර සභාව නෙවෙයිද හදලා දෙන්නේ කියලා.ඒ අය අපිට ඒවා කියන්නේ ඔබතුමාට ඒක කියන්න.මගේ පුතාගෙත් අත කැඩුනේ ඒ කානුවට වැටිලා.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
ඒ කියන්නේ සිරි නිවාස පාරයි ,රේගුව පාරයි එකුත වෙන තැන නේද? ඒ සම්බන්ධයෙන් ලියුම් යැව්වා පස් වතාවකට වඩා. ඒක පී ආර් ඩී ඒ එකේ පාරක්. අපිට අත තියන්න බැහැ. එහෙම කරොත් ඒක නීති විරෝධී.

__ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා__
අනිත් එක දැන් ඩෙංගු මදර්න වැඩසටහනක් තියෙනවනේ. අපිට පී.එච්.අයි මහත්තයාගෙන් වාතර්ාවක් අවශ්‍ය කරනවා දැන් ඩෙංගු රෝගීන් කී දෙනෙක් බේරුවල ඉන්නවද කියලා. අපිට පී එච් අයි මහත්වරුන්ගෙන් ඒ පිළිබඳ වාතර්ාවක් ලබා දෙන්න කොට්ඨාශ මට්ටමින් හරි සභා සීමාවෙන් හරි.

__ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා__
පී.එච්.අයි මහත්තයා දැන් ප්‍රයිවට් ඒවට ගියොත් ඒක දන්නේ නැද්ද. මගේ යාළුවෙක් ඉන්නවා දීනගොඩ. එයා ලංකා හොස්පිට්ල් එකේ ඉන්නේ. ඔබතුමා දීනගොඩ කවුරුත් නැහැ කියපු හින්දා මම කිව්වේ.

__ගරු උප සභාපති - එම්.ආර්.එම්.මුනව්වර් මහතා__
එහෙම වාතර්ා කරානම් අපිව පොඩ්ඩක් දැන්වත් කරන්න. මට පොඩ්ඩක් ඒ වාතර්ාව වට්ස්ඇප් කරන්න. එතකොට අපිට ජනතාව දැනුවත් කරන්න පුලුවන්නේ වොයිස්කට් එකක් තියලා හරි අපිට.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
MOH එකේ ලේඩි කෙනෙක් ඉන්නවා. සභාවට ප්‍රයෝජනයක් නැහැ. සමහර දවස්වලට එනවා. සමහර දවස්වලට යනවා. එයාට අපේ සභාව තුළ ඉඩක් වෙන් කරන එක තේරුමක් නැහැ. ඒක හින්දා සමහරු යෝජනා කරලා තියෙනවා එයාව එතනින් අයින් කරන්න කියලා. එහෙම අනවශ්‍ය එක්කෙනෙක් තියාගන්න එක අපිට තේරුමක් නැහැ.

__ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්ෆීර් මහතා__
සභාපතිතුමා, මේගොල්ලන්ට සභාවෙන් මොනවා හරි උදව්වක් කරන්න පුලුවන්නම් අපිට කරන්න පුලුවන්නේ.

__ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා__
දැන් අපේ තණකොළ කපන මැෂින් වලට ගහන්න තෙල් නැහැ. මෙයාලගේ අවශ්‍යතාවලට ගහන්න තෙල් නැහැ. අපි පෙට්‍රල් ටිකක් ගෙනල්ලා තියාගමු.
මේකෙ ඉන්න නිලධාරීන්, නිලධාරිනියන් සමහර දේවල් සම්බන්ධයෙන් පැමිණිළි එනවා.

**<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්පීර් මහතා</u>**
අපි නගර සභාව වටේට කැමරා දාමුකෝ. එතකොට හොරු අල්ලන්න තව එක්කෙනෙක්ව තියන්න ඕනේ නැහැනේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
නගර සභාව වටේ කැමරා ගහලා ස්ටෝරුවේ යන ඒවා අල්ලන්න පුලුවන්ද. රට වටේ කැමරා දැම්මත් රටේ හොරකම් අල්ලන්න පුලුවන්ද. අපි අපි එක එක්කෙනා හිතන්න ඕනේ අපේ වගකීම් මොනවද, රාජකාරි මොනවද, යුතුකම් මොනවද කියලා.

**<u>ගරු මන්ත්‍රී - එම්.එස්.මොහමඩ් මුස්පීර් මහතා</u>**
මේවට පොඩි දඩුවම් දීලා වැඩක් නැහැ. ඒගොල්ලන්ව අයින් කරලම දාන්න ඕනේ.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**
කලින් ඔහොම විරුද්ධ වෙලා වළවල් බදින්න බැහැ කියලා සභාවේ සම්මත කළා.රෑ ඇවිල්ලා වළ ආපහු බැන්දා. අර මිනිහා ඇවිල්ලා යකඩයි, උදළුයි අරගෙන ගෙදරටම එළවන් ගිහිල්ලා ගහන්න. වළ බැදලා උදේ ඔක්කොම කරලා ඉවර වුනා. ෆලීල් මහත්තයා මාත් එක්ක කිව්වා තමුන්නාන්සේලාගේම මිනිස්සු තමයි මේ වැඩේ කරන්නේ අපේ මිනිස්සු ගිහිල්ලා කරන්නේ නැහැ. අපිට ඒ මිනිස්සු එක්ක රණ්ඩු වෙන්න බැහැ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
ගරු මන්ත්‍රීතුමා, අතීතයේ ඉදන් එහෙම දීපු හින්දා තමයි දැන් මේ හෙනේ. පාරේ වළලලා යන්නේ ඒකයි. ඒකට ඉඩ දෙන්න එපා. තමන්ගේ සපෝටර් කෙනෙක් වුනත් ඒකට ඉඩ දෙන්න එපා.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**
දැන් බණ්ඩරවත්තට ඒ නීතිය දාලා තිබුනේ මම මේ සභාවේ යෝජනාව ගෙනාපු හැටිය මම විරුද්ධ වුනා.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
විරුද්ධ වුනාට කරන්න දෙයක් නැහැ. යථාර්ථය තේරුම් ගන්න.

**<u>ගරු මන්ත්‍රී - එම්.ඇක්ලන්ඩ් ප්‍රනාන්දු මහතා</u>**
ඒ ගෙදර මිනිස්සුන්ට කියලා තමයි මේ වළ බදිනවට විරුද්ධ වුනේ. ඒ මිනිස්සු මට පාරට බැහැලා ගහන්න ආවේ.

**<u>ගරු සභාපති - අල්හාජ් එම්.මසාහිම් මොහමඩ් මහතා</u>**
ඉතින් ඒක තමයි ඇත්ත. මන්ත්‍රීතුමා, ඔබතුමා සමාජ සේවකයෙක් හැටියට, ගරු මන්ත්‍රී කෙනෙක් හැටියට ඔබතුමා විරුද්ධ වෙන්නට ඕනේ.
අපි මේ රට ගැන හිතලා සමාජය ගැන හිතලා, මිනිස්සු ගැන හිතලා, අනාගතය ගැන හිතලා, අපේ ළමයින් ගැන හිතලා අපි කටයුතු කරානම් මෙහෙම දෙයක් වෙන්නේ නැහැ. ලෝකයේ හොඳම රටක් වෙලා තිබුන ලංකාවට අද මොනවද වෙලා තියෙන්නේ. ලෝකයේ පල්ලෙහාටම වැටිච්ච රටක් බවට අද පත්වෙලා තියෙනවා. ඒක හින්දා අපේ එදා ඉදලා වැඩ කරපු කට්ටිය, අද වැඩ කරන කට්ටිය, අනාගතයේ වැඩ කරන්න ඉන්න කට්ටියට ආදශර්යක් වෙන අන්දමට වැඩ කරලා තිබුණානම් මේ හෙනේ ගහන්නේ නැහැ.
අපේ ඇළ මාගර් පහක් තියෙනවා අපේ නගර සභා බලප්‍රදේශය තුළ. අපි ආපු හැටිය ඒ ඇළ මාගර් පහ සුද්ද කරා. එක එක ඇළ මාගර් සුද්ද කරන්න ලක්ෂ 50 ට වැඩිය ගියා. අපේ කැපවීම මත තමුන්නාන්සේලාගේ ඉල්ලීම මත අපි ඔක්කොම සුද්ද කරලා දැම්මා. සම්පූණර්යෙන්ම ගංවතුර නැති වුනා නගර සභා බල සීමාව තුළ. දැන් ආයෙත් පොඩ්ඩ පොඩ්ඩ බ්ලොක් වීගෙන ඇවිල්ලා දැන් ආයෙත් ඒක නැති වෙන තත්ත්වයට ඇවිල්ලා ඒක හින්දා අපි ඒක කාට හරි හොඳට කරගන්න පුලුවන් කෙනෙක්ට දීලා ඒ ඇළ මාගර් පහ සුද්ද කරගමු.

ඒවගේම අපේ පිටවල සොහොන ගැන අපි සාකච්ඡා කරා. ඇත්ත වශයෙන්ම මට තියෙන උනන්දුව හින්දා තමයි මේ සභාවට පළවෙනි වතාවට ස්වාධීන කණ්ඩායමක් හැටියට දිනලා ආපු හැටිය ඉස්සෙල්ලාම මගේ මුළු ටීම් එකම දාලා අපි සුද්ද කරා. අපි ගාව ආගම්භේද තියෙනවනම්, ජාතිභේද තියෙනවනම් කවදාකවත් එහෙම දේකට බහින්නේ නැහැ කවුරුවත්. නමුත් අපි බැස්සේ හොඳම චේතනාවෙන් මේක පිරිසිදු කරලා මෙතන ආදාහනාගාරය දාලා අපිත් එක්ක ජීවත් වෙන අපේ සහෝදර ජනතාවට ඉස්ලාම් ආගමේ බද්ධාගමේ උනත් වුනත් ඕගොල්ලෝ පාවිච්චි කරන මේ අවශ්‍ය කතර්ව්‍ය මේ නගර සභාවෙන් ඉෂ්ට කරලා දෙන්න ඕනේ කියලා තමයි ඒ වැඩේට බැස්සේ. එතකොට අපිට කෝටි 75 ක් එන්න තිබුනා ඉන්දියාවෙන්. මුලින්ම අපි වෙන්කරේ මේ ආදාහනාගාරය හදන්න. කෝටි එකහමාරක් වෙන් කරා. නමුත් ඒ සල්ලි ආවේ නැහැ. අපේ නරක කාලෙට. ඒක හින්දා ඒ වැඩේ අපිට තාම කරගන්න බැරි වුනා.

ඒ වගේම තමයි අපි දැන් මෙතන කතා කරා ගෑස් සම්බන්ධව. ඒ ගෑස් සම්බන්ධ තීණ්දුව අපි අරන් මජරින් මහත්තයාට ස්තූතිවන්ත වෙන්නට ඕනේ 1000 ක් හරි අපේ ජනතාවට මේ ගෑස් ලබා දීම සම්බන්ධව. මිනිස්සු දුක් විඳිනවා අපිට ගෑස් එකක් ලබා දෙන්න කියලා. ළමයින් බඩගින්නේ උයාගන්න විදියක් නැහැ. අපිට ලාම්පු තෙල් ලිපක්වත් නැහැ. දරත් නැහැ. ඔක්කොම නාගරිකව ජීවත් වෙන කට්ටිය. ඉතින් ඒගොල්ලන්ට උදව්වක් වශයෙන් තමයි මේක ගෙන්නුවේ. නමුත් මේක ගෙන්නලා බෙදලා දීලා අපිට හොඳක් අහන්න බැරිනම් අපි මේක තව පාරක් ගෙන්නන එකේ තේරුමක් නැහැ. ඒක හින්දා අපි කිව්වා ඒක මෙහාට ගෙන්න ගන්නේ නැතුව වෙන කොහෙට හරි ගෙන්නගෙන මේ වැඩේ කරමු කියලා.

ඒ වගේම අපි මෙතන සාකච්ඡා කරා වෝටබෝර්ඩ් එකයි, ටෙලිකොම් එකයි සම්බන්ධව. වෝටබෝර්ඩ් එකේ ඒගොල්ලෝ හිතුන හිතුන තැන්වලට එක එක්කෙනාට කොන්ත්‍රාත් දීලා ඉවර වෙලා අපේ පාරවල් කඩාගෙන යනවා. ඒකට දැන් මිලියන පහකට වැඩිය සල්ලි අපිට වෝටබෝර්ඩ් එකෙන් ගන්න තියෙනවා. ඒක එස්.ඩබ්ලිව් මහත්තයට බාරයි. එස්.ඩබ්ලිව් මහත්තයා වහාම ඒක ගැන නිරීක්ෂණය කරලා, අධීක්ෂණය කරලා ඒකට ඇස්තමේන්තු කරලා ඒ සම්බන්ධව අයකරගන්න දේවල් බලන්න. එතකොට අපි මේකට පස්සෙන් ඉන්නවා කියලා එගොල්ලෝ දැනගත්තොත් තමයි ඒ වැඩපිළිවෙල ඒගොල්ලෝ හරියට කරන්නේ. නැත්නම් හරියට කරන්නේ නැහැ. ඒ වගේම තමයි ටෙලිෆෝන් බිල. දැන් 26 වෙනිදා උදේ 10.30 ට ඒ දෙපැත්තම කැඳවන්න. එතකොට ඒගොල්ලෝ එනකොට තොරතුරු ඔබතුමාලා අතේ තියාගන්න. ඒක ඉතාමත් අත්‍යවශ්‍යයි.

ඒවගේම අද වතර්මාන තත්ත්වය ලංකාව අද ලෝකයේ පල්ලෙහාම තත්ත්වයට වැටිච්ච රටක් හැටියට අද පත්වුනා. ඇයි එහෙම පත්වුනේ. කවුද මේකට වගකියන්න ඕනේ. එදා ඉඳලා අවුරුදු 72 ක් තිස්සේ ඉඳලා එන මාගර්යද, එහෙම නැත්නම් මේ වතර්මාන රජයද. කවුද මේකට වගකියන්න ඕනේ. අපි දැන් වලේ වැටිලා ඉන්නේ. අගාදයේ වැටිලා ඉන්නේ. දැන් කොහොමද අපි ගොඩ එන්නේ. ඒක ගැන තමයි අපි දැන් සාකච්ඡා කරන්නට ඕනේ. ඒක සාකච්ඡා කරලා අපි අවංක වෙන්නට ඕනේ. අපිත් සාධාරණ වෙන්නට ඕනේ. අපි නීතිගරුක වෙන්නට ඕනේ. අපේ ළමයින්ට අපි ජාතිභේද උගන්නනවා නම් අපේ ළමයින්ට අපි ආදශර්ය දෙනවානම් අපේ ක්‍රියාවෙන් කතාවෙන් ගෙදර කතා කරන එක තමයි ළමයා පංතියට ඇවිල්ලා කතා කරන්නේ.

නමුත් ජපානය ගත්තොත් ළමයා කොහොමද හැසිරෙන්න ඕනේ, ළමයා කොහොමද පිරිසිදුවට ඉන්න ඕනේ, ළමයා පංති කාමරයේ කොහොමද පිරිසිදුවට තියාගන්නේ. ගේ අවට කොහොමද පිරිසිදුව තියාගන්න ඕනේ. ළමයා කොහොමද වැඩිහිටියන්ට ගරු කරලා කතා කරන්න ඕනේ. ළමයි කොහොමද වීවසර්ලට ගරු කරලා කතා කරන්නට ඕනේ. ඒ වගේ අනාගත පාරදෘශ්‍යභාවය ඇතුව තමයි ඒගොල්ලෝ උගන්වන්නේ. අපි මොනවද අපේ ළමයින්ට උගන්වන්නේ. ඊර්ශ්‍යාව, වෛරය, ක්‍රෝධය අපේ හදවතේ තියෙන එක තමයි අපි ළමයින්ට උගන්වන්නේ. ඉතින් ඒකත් එක්කම වැඩෙන ළමයාගෙන් හොඳ දෙයක් බලාපොරොත්තු වෙන්න බැහැ. හොඳට ඉගෙන ගත්ත ගෙදර අම්මා, තාත්තා කතා කරන විදියට තමයි ළමයින් කතා කරන්නේ. ගෙදර ඇති කරන ගිරවා කතා කරන්නේ. එන්න පුතා, කන්න පුතා, වාඩිවෙන්න පුතා කියලා තමයි හොඳ ගෙදරක ගිරවා කතා කරන්නේ. අධ්‍යාපනයක් නැති, ජාතිවාදයෙන් ආගම්වාදයෙන් උදුම්මවාගෙන ඉන්න ගෙදරක මොනවද කතා කරන්නේ මෙහාට වරෙන්, එහාට පලයන් එහෙමනේ කතා කරන්නේ. එහෙම තමයි ඒ ගිරවත් කතා කරන්නේ. මම කියන්නෙ සමාජයේ වෙන දේවල්. ඒක හින්දා පක්ෂභේදය අපිට වැඩක් නැහැ. ඒක තමයි මේ රට නැති කරේ.

ලෝකයේ උතුම්ම රට. අග්නිදිග ආසියාවේ මුතු ඇටය. ඉන්දියන් සාගරයේ මුතු ඇටය කියලා නිකන් නමක් ගන්න බැහැ. ඒච්චර හොඳ එච්චර දියුණු රටක්. මම චීනයේ ගිය වෙලාවේ මිට අවුරුදු දෙකකට පෙර නගරයේ ඉදලා කිලෝමීටර 1600 ක් එහාට ගියා සාමාන්‍යයෙන් මුළුගැන්විච්ච ගමකට. ඒක මුළුගැන්වුන ගමක් වුනාට දසලක්ෂයකට වැඩිය ජනතාව ඒ ගමේ ජීවත් වෙනවා. ඒ මහා නගර සභාවෙන් තමයි ලංකාවෙන් තෝරාගත්තු නගරාධිපතිවරු දහදෙනෙක් ගෙන්නුවේ. මහින්ද රාජපක්ෂ මහත්තයා තමයි මාව තෝරලා ලීඩර් කරලා ටීම් එකත් එක්ක එහෙට යැව්වේ. එහෙ ගිහිල්ලා අපි බලනකොට ඒගොල්ලන්ට එයාපෝර්ට් එකක් තියෙනවා, යුනිවසර්ිටි එකක් තියෙනවා, ඒගොල්ලන්ට හොටෙල්ස් තියෙනවා, වටේටම මුහුද තියෙනවා. ඒ මුහුදේ අවුරුදු 1400 කට පෙර මියුසියම් එකක් තියෙනවා. ඒ මියුසියම් එක අපිට පෙන්නන්න ගියා. ඒක ලංකාවේ හොයාගත්තේ තෝරගත්තේ ඒකට තමයි. ඒ මියුසියම් එකට අපි ගිහිල්ලා මේවගේ ලොකු ෆ්රේම් එකක් ගහලා තියෙනවා. ඒ ෆ්රේම් එකේ චයිනා ගම ගහලා තියෙනවා. ඒ ගම ඉදලා මුහුද දිගේ අවුරුදු 02 ක් වෙනවා ලංකාවේ. ලංකාවට ඇවිල්ලා තමයි ඒගොල්ලෝ බිස්නස් කරන්නේ. ලංකාව තමයි ප්‍රධාන ආදායම් මාගර්ය. ඇත්දළ, මැණික්, කුරුඳු, කරාබු නැටි, සාදික්කා, එනසාල්, වසාවාසි ඒවා තමයි ගෙනියන්නේ. සමහරු නැව් දහය පහලොව කුණාටුවට අහුවෙලා විනාස වෙනවා. ඒ රිස්ක් එකත් අරගෙන මෙහෙ ඇවිල්ලා නතර වුන තැන තමයි චයිනාෆෝට් කියලා කියන්නේ. ඒගොල්ලෝ මේ මරදාන ලෙල්ලම ගාව තමයි නැව් පාකර් කරලා ඇවිල්ලා තියෙන්නේ. ඒක  තමයි ඉතිහාසය. අවුරුදු දෙදාහකට පෙර ඉදලා ලංකාවේ එච්චර ප්‍රසිද්ධයි. එහෙම තිබුන රටක් තමයි අද ඉන්දියාවේ යාචකයෝ සල්ලි එකතු කරලා අපිට එවන තත්ත්වයට අද පත් වුනේ. ඉතින් මේක හරි කණගාටුයි. මේ තත්ත්වය ගැන අපිට හරි කණගාටුයි. මෙහෙම ගියාම ලබන පාර අපි දේශපාලනය කරන එක තේරුමක් නැහැ. අපිට හිඟා කන්න වෙනවා. ලබන දෙසැම්බර් වෙනකොට රුපියල් පන්සීයට වඩා පාන් රාත්තල යනවා. ලබන මාසෙ වෙනකොට හාල් නැහැ කන්න. ඒ තත්ත්වයට පත් වෙනවා. අපි වතුර හට්ටියෙ උනු වෙන කකුළුවෝ වගේ. හට්ටිය කොච්චර උනු වෙනවද කියලා අපි දන්නේ නැහැ.

තව මාස දෙක තුනකින් අපිට තේරෙයි. ඉන්ධන ගැන අපි දැන් කතා කරා. මේ රාජ්‍ය සේවකයින්ට ඉන්ධන දෙන්න අපි කතා කරා. ඉන්ධන කලදක් දෙන්න බැරි වෙනවා. ඒ තත්ත්වයට අපි ඔක්කොම පත් වෙනවා. අපිව අතඇරලා දානවා මුළු ලෝකෙම. අපි ඒගොල්ලෝ එක්ක හොඳට ඉඳපු හින්දා. මොකද ජපානයට මුළු ලෝකයම තහංචි පන්නලා කවුරුවත් සතයක්වත් ජපානයට ආධාර දෙන්න හොඳ නැහැ. සලකන්න හොඳ නැහැ ඒක හින්දා ඒගොල්ලන්ට දඩුවම් දෙන්න ඕන කියලා අපේ රාජ්‍ය තාන්ත්‍රිකයා අපේ රටේ නායකයා ජේ.ආර්.ජයවධර්න මහත්තයා තමයි ඒ සභාව මෙහෙයෙවුවේ. එතුමා කිව්වේ 'නහී වේරේන වේරාණි' කියලා සමාව අරගත්තා. එදායින් පස්සේ ඒ වචනේ තමයි මුළු ලෝකෙම හැදුනේ. ජපානයට සමාව දුන්න හින්දා තමයි ජපානය මේ තත්ත්වයෙන් ඉන්නේ. ඒක හින්දා තමයි මිලියන පනහකට වැඩිය ජපානය ඩොලර් එවන්න ඉන්නේ. එදත් ආසියාවේ ලොකුම හොස්පිට්ල් එක හැදුවේ ජපානය ජේ.ආගෙර් ඉල්ලීම හින්දා. ඉතින් ඒවගේ දේවල් හින්දා අපේ සමහර ජාතිවාදි දේවල් හින්දා ලෝකේ රටවල් අපෙන් වෙන් වුනා. ඒකයි වුනේ ඒක අපි තේරුම් ගන්නට ඕනේ. ඒක තේරුම් ගන්නේ නැතුව අපි ගමන් කරනවා නම් අපි වගේ මෝඩයෝ නැහැ. දැන් අපි ඔක්කොම එකතු වෙලා හරි ගමන අපි තෝරාගන්නට ඕනේ. අපේ සභාවෙන් අපි ගමට දෙන ආදශර්, අපේ ළමයින්ට දෙන ආදශර්ය අපේ සභා වපසරිය තුළ අපිට හදාගන්න පුලුවන්නම් දෙයියන්ගේ පිහිටෙන් අපිට ප්‍රාදේශීය සභාවත් හදාගන්න පුලුවන්. කළුතර දිස්ත්‍රික්කෙත් හදාගන්න පුලුවන්. රටම ජයග්‍රහණය කරන්න පුලුවන්. අද මේ පත්වෙලා ඉන්න රටේ තත්ත්වයෙන් කවදා මිදෙන්න පුලුවන් වෙයිද දන්නේ නැහැ. මෙහෙම යනවනම් අඩුම ගානේ අවුරුදු පහකටවත් යන්න වෙනවා මට තේරෙන විදියට. ඒකෙන් අපිව බේරගන්න ලෝක පාලකයින්ට විතරයි පුලුවන්. අද වෙනතුරු මෙච්චර කල් මේ ප්‍රශ්නය ඇවිල්ලා පාලර්මේන්තුවෙන් මොනවද ගත්ත තීන්දු. අපි එක එක්කෙනාට බෝලෙ පාස්කරගන්නවා ගහගන්නවා බැනගන්නවා.

ඒගොල්ලන්ගේ ගේ ගිනි තියපු ගෙයක් හදන්න කියලා කියනවා. ඒගොල්ලන්ට යන්න එන්න වාහන නැහැ. ඒගොල්ලන්ට යන්න එන්න ඉන්ධන නැහැ. ෂැංග්‍රිලා හෝටලයේ කාමර ඉල්ලනවා. ඉතින් මේවා තමයි වෙන්නේ. එහෙම රටක් දියුණු වෙයිද ගොඩදාන්න පුලුවන්ද. ඒක හින්දා


තමුන්නාන්සේලා මෙච්චර ප්‍රශ්න තියාගෙනත් අද සභා රැස්වීමට ගරු කරලා පැමිණීම ගැන නගරාධිපතිතුමා හැටියට මම තමුන්නාන්සේලාට ස්තූතිවන්ත වෙනවා. අපිට අනාගතයේදි Zoom meeting එකක්වත් තියාගන්න විදුලියත් නැති වෙන තත්ත්වයක් තියෙන්නේ. පැය 24 ම විදුලිය කපන තත්ත්වයක් තියෙන්නේ. සමහර රටවල සතියකට එක දවසයි කරන්ට් එක දෙන්නේ. ඒ තත්ත්වයට අපි ක්‍රමක්‍රමයෙන් ගමන් කරමින් ඉන්නවා. ඒකෙ ආදීනව අපිට ඉස්සරහට තේරෙයි. ඒක හින්දා අපි ඔළුව පාවිච්චි කරලා වැඩ කරමු. තමුන්නාන්සේලා සියලු දෙනාට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. සභාවේ කටයුතු මෙයින් අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ප:ව:12.48** ට සභාවේ කටයුතු අවසන් විණ.

***මෙම සභා වාතර්ාවේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් ඇති වූවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුත්තේ ය.***



**අශෝක රණසිංහ,**
**ලේකම්,**
**බේරුවල නගර සභාව.**



**අල්හාජ් ඇම්.මසාහිම් මොහොමඩ්,**
**සභාපති,**
**බේරුවල නගර සභාව.**